# සමූපකාර තොග වෙළඳ සංස්ථාව

## 2010.12.31 දිනෙන් අවසන් වසර සඳහා වාර්ෂික ගිනුම්

# සමුපකාර තොග වෙළඳ සංස්ථාව
# වාර්ෂික වාර්තාව
# 2010

## ඇතුල් පිටු


| | |
|---|---|
| අධ්‍යක්ෂ මණ්ඩලය සහ විධායක නිළධාරීන් | 01 - 02 |
| සභාපතිතුමාගේ සමාලෝචනය | 03 - 04 |
| අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව | 05 - 08 |
| මූල්‍ය ප්‍රකාශන | 09 - 25 |
| මූල්‍ය ප්‍රකාශන වලට සටහන | 26 - 27 |
| විගණකාධිපතිගේ වාර්තාව | 28 - 51 |
| විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ | 52 - 64 |

# සමුපකාර තොග වෙළඳ සංස්ථාව

## අධ්‍යක්ෂ මණ්ඩලය - 2010

| | |
|---|---|
| සභාපති | :- එච්.සාගර කාරියවසම් මහතා<br>අධිනීතිඥ (2010 පෙබරවාරි 16 දින දක්වා)<br><br>එරාජ් ඊ.ප්‍රනාන්දු මහතා<br>(2010 ජූනි 15 දින සිට) |
| ක්‍රියාකාරී අධ්‍යක්ෂ | :- කමල් මුස්තාපා මහතා<br>(2010 මැයි 10 දින දක්වා)<br><br>කේ.එම්.එම්.ෂාකීර් මහතා<br>(2010 ජූනි 15 දින සිට) |
| අධ්‍යක්ෂවරුන් | :- ඩී.විදානගමාච්චි මහතා<br>(මහා භාණ්ඩාගාර නියෝජිත)<br>අධ්‍යක්ෂ ජනරාල්<br>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව (මහා භාණ්ඩාගාරය)<br>(2010 මැයි 07 දක්වා)<br><br>ජානකී කුරුප්පු මහත්මිය<br>(2010 මැයි 10 දින දක්වා)<br><br>කේ.එන්.ආර්.ප්‍රනාන්දු මහතා<br>(2010 මැයි 07 දින දක්වා)<br><br>අනුර රොහාන් ගම්ලත් මහතා<br>අධිනීතිඥ (2010 මැයි 07 වන දින දක්වා)<br><br>එච්.චන්ද්‍රකුමාර් ද සිල්වා මහතා<br>අධිනීතිඥ (2010 මැයි 10 දින දක්වා)<br><br>එම්.පී.එස්.එම්.මොහොමඩ් ජවාඩ් මහතා<br>(2010 මැයි 31 දින සිට)<br><br>ඩොනල්ඩ් ඇන්තනී බුල්ජාන්ස් මහතා<br>(2010 මැයි 31 දින සිට) |

ඩී.සී.එල්.ලංකාතිලක මහතා

(2010 මැයි 31 දින සිට)

පී.ධර්මදාස මහතා

අතිරේක ලේකම් / සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ

අමාත්‍යාංශය

(2010 ජුනි 28 දින සිට)

කේ.එම්.ජයතිලක මහතා

(මහා භාණ්ඩාගාරික නියෝජිත)

අතිරේක අධ්‍යක්‍ෂ ජෙනරාල්

විගණන හා කළමණාකරන දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

(2010 ජුලි 15 දින සිට)

වැඩ බලන මුදල් කළමනාකරු :- එම්.මෙරිල් පෙරේරා මහතා

මාණ්ඩලීය ලේකම් :- ප්‍රදීපිකා ලක්මාලි සුදසිංහ මහත්මිය

විගණකවරුන් :- විගණකාධිපති

බැංකුකරුවන් :- ලංකා බැංකුව

මහජන බැංකුව

හැටන් නැෂනල් බැංකුව

කොමර්ෂල් බැංකුව

සම්පත් බැංකුව

ලියාපදිංචි කාර්යාලය :- අංක 27, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

# 2010 වාර්ෂික වාර්තාව - සභාපතිගේ පණිවිඩය.

සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ ගරු අමාත්‍යතුමා විසින් සතොස අයතනයේ සභාපති වශයෙන් 2010/06/15 දින සිට මා පත්කරන ලදී. එදින සිට අදාල පාර්ශවයන් වෙතින් සෑම ක්ෂේත්‍රයකටම අදාලව තොරතුරු ලබාගනිමින් කරන ලද අධ්‍යනයන් අනුව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

ආයතනය සතු සම්පත් බොහොමයක් නිෂ්කාර්‍යව පවතින බවත්, මූල්‍ය හා ගිණුම් කටයුතු වලින් ලබාදෙන තොරතුරු වල දුර්වලතා තිබෙන බවත්, මූල්‍ය දුෂ්කරතා සහ රාජ්‍ය හා පෞද්ගලික බැංකු කිහිපයක් වෙත රුපියල් මිලියන 500 කට ආසන්න විශාල ණය මුදලක් ගෙවීමට ඇති බවත්, සමස්ථයක් වශයෙන් ආයතනය ඵලදායී ආර්ථික හෝ ව්‍යාපාරික කටයුත්තක නොයෙදෙන බවත්, ඒ අතර වැදගත් ලෙස කැපී පෙණුනි.

එහෙත්, ආයතනය සතු මානව හා භෞතික සම්පත් හැකිතාක් උපරිම ලෙස උපයෝජනයට ගතහැකි සැලසුම් සහගත වැඩපිළිවලක් තුලින් ක්‍රමානුකූලව ව්‍යාපාර කටයුතු වලට අවතීර්ණය වීමටත්, බදු කුළී ආදායම් වැඩි කර ගැනීමටත්, මූල්‍ය ශක්තිය ගොඩනගා ගැනීමට සුදුසු ක්‍රියා මාර්ග ගැනීමෙන් බැංකු වෙත ගෙවිය යුතු ණය මුදල් සම්බන්ධයෙන් විශ්වාසනිය එකඟතාවයක් ගොඩනගා ගැනීමෙන් නැවත බැංකු සමඟ ව්‍යාපාරික කටයුතු වලට එළඹීමේ පසුබිමක් හා හැකියාවක් ගොඩනගා ගැනීමටත් හැකි වනු ඇතැයි විශ්වාස කරමි.

2010 වසර අවසාන භාගයේ දී විවෘත වෙළඳපලෙහි බිත්තර හා කුකුළු මස් මිල පාලනය කර ගත නොහැකි ලෙස ඉහල යාමේ දී එයට විසඳුමක් ලෙස අසාමාන්‍ය අන්දමින් මිල ඉහල යාම වලක්වා ගැනීම සඳහා සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ ගරු ඇමතිතුමාගේ උපදෙස් හා මග පෙන්වීම මත රජය වෙනුවෙන් මැදිහත් වීමට සතොසට හැකි විය.

ඒ අනුව, දේශීය නිෂ්පාදකයන්ගෙන් බිත්තර මිලදී ගැනීම, තොග හා සිල්ලර අලෙවිය සඳහා ෆාම් ෂොප් අලෙවිසැල් ආරම්භ කිරීම, සහ ලංකා සතොස සමඟ බෙදාහැරීමේ ක්‍රමවේදයන් පවත්වා ගැනීමෙන් එලෙස අසාමාන්‍ය අන්දමින් මිල ඉහල යාම වලක්වා ගැනීමට හැකි විය. විවෘත වෙළඳපල තුල රජය වෙනුවෙන් මිල පාලනය කිරීමේ හස්තයක් ලෙස සතොසට ඇති හැකියාව ඒ තුලින් සනාථ කර පෙන්වීමට හැකිවීම ආයතනය ලද ජයග්‍රහනයකි.

වසර හයක් (06) පමණ කාලයක් ඌන උපයෝජන තත්වයේ පැවති ආයතනය සතු පන්නෙගමුව හා හිඟුරක්ගොඩ පිහිටි සහල් සැකසුම් මධ්‍යස්ථාන දෙක පවතින තත්වයට වඩා දියුණු කිරීම තුලින් එහි නිෂ්පාදන ධාරිතාවය ඉහල නැංවීමට අපේක්ෂා කර ඇත.

ඒ අනුව, 2010 වසර අගභාගයේ දී මෙම සහල් සැකසුම් මධ්‍යස්ථාන දෙක වැඩිදියුණු කිරීම සඳහා කටයුතු ආරම්භ කරමින් ඞී අලෙවි මණ්ඩලය සහ ලංකා සතොස යන ආයතන දෙක සම්බන්ධ කර ගනිමින් සහල් නිෂ්පාදනය සහ බෙදාහැරීම සඳහා රජය වෙනුවෙන් ඵලදායී ආර්ථික ක්‍රියාදාමයක නිරතවීමට කටයුතු සලසා ඇත.

ඉහත සඳහන් කළ පරිදි ආයතනය සතු සම්පත් නැවත විධිමත් වැඩපිළිවලක් තුලින් ඵලදායී අන්දමින් යොදාගෙන ආදායම් වැඩි කර ගනිමින් මූල්‍ය ශක්තිය දියුණු කර ගැනීමට අපේක්ෂා කරමු.

මෙම වැඩපිළිවල සාර්ථක කර ගැනීම තුල මූල්‍ය දුෂ්කරතා සමනය කර ගැනිමටත්, ණය බර පියවීමටත්, බැංකු ආයතන සමඟ විශ්වාසනීය අවබෝධයක් ඇති කර ගෙන ආයතනය සාර්ථකව ඉදිරියට පවත්වා ගැනීමට අපේක්ෂා කරන්නෙමු.

මේ සඳහා සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ ගරු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමාගෙන් ලැබෙන මඟ පෙන්වීමත්, ධෛර්යයත්, ගෞරවයෙන් ස්තුතිපූර්වකව ඉතා අගය කොට සලකමු.

අමාත්‍යාංශ ලේකම්තුමාත්, අමාත්‍යාංශයේ නිලධාරී මණ්ඩලයත්, මහා භාණ්ඩාගාරයේ නිලධාරී මණ්ඩලයත්, ලබාදෙන සහයෝගයද ස්තුතිපූර්වකව මා අගය කරමි.

ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයත්, කාර්ය මණ්ඩලයත්, වෘත්තීය සමිතියත් ලබාදෙන සහයෝගයද මේ අවස්ථාවේ දී ස්තුතිපූර්වකව සඳහන් කරමි.

සභාපති.
2012/10/08

## 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව.

1971 අංක 38 දරණ මුදල් පනතේ අංක 14 වගන්තිය ප්‍රකාර සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ 2010/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මේ සමඟ ඉදිරිපත් කරනු ඇත.

01. **පොදු කරුණු:-**

**මූලික ක්‍රියාකාරකම්-**

1949 අංක 47 දරණ පනතින් ස්ථාපිත කරන ලද සමුපකාර තොග වෙළඳ සංස්ථව (සතොස නමින් වඩාත් ප්‍රචලිත) සිය ව්‍යාපාරික කටයුතු 1950 ජූලි 01 දින සිට ආරම්භ කරනු ලැබ ඇත.

ආරම්භයේ දී සතොසහි මූලික පරමාර්ථය වනුයේද අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය වෙනුවෙන් තොග සහ සිල්ලර වෙළෙන්දෙකු වශයෙන් කටයුතු කරනු ලැබීමයි.

එහෙත්, වසර 50 කට වඩා වැඩි කාලයක් ශ්‍රී ලාංකික පාරිභෝගික සහ ගොවි ජනතාවගේ සුබසිද්ධිය සඳහා ව්‍යාපාර කටයුතු සිදු කිරීමේ දී මුහුණ දෙන ලද දැඩි මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ඉදිරිපත් කරන ලද 2004 වර්ෂයේ හා 2006 වර්ෂයේ ස්වේච්ඡා වන්දි යෝජනා ක්‍රමයෙන් පසුව ලංකා සතොස ආයතනය වෙත මූලික පහසුකම් සැලසීම පෙරදැරිව කටයුතු කරන අතර, මේ වන විට ෆාම් ෂොප් අලෙවිසැල් සහ ආයතනය සතු සහල් මෝල් නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් පවතී.

02. **ව්‍යාපාරික කටයුතු සමාලෝචනය කිරීම.**

අධ්‍යක්ෂ වරුන්ගේ වාර්තාවේ ද කොටසක් වන සභාපතිගේ අදහස් දැක්වීම් යටතේ ආයතනය පිළිබඳව වර්තමාන තත්වය පිළිබඳව සඳහන් කර ඇත.

ඒ අනුව, දැනට ප්‍රධානතම ආදායම් මාර්ගය වී තිබෙන ලංකා සතොස ආයතනයට සහ වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වෙත ආතනය සතු දේපල කුලියට දීමෙන් ආදායම් ඉපයීම තවදුරටත් වර්ධනය කර ගනිමින් ආයතනය සතු ප්‍රවාහන අංශය වැඩි දියුණු කිරීමෙන් ලංකා සතොස වෙත වඩාත් සාධාරණ සහ කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබාදීමත්, පන්නෙගමුව හා හිඟුරක්ගොඩ පිහිටි සහල් සැකසුම් මධ්‍යස්ථානයන්හි වී අළෙවි මණ්ඩලය සමඟ එක්වී නැවත නිෂ්පාදන කටයුතු ආරම්භ කර උසස් තත්වයේ සහල් සාධාරණ මිලකට පාරිභෝගික ජනතාව වෙත ලංකා සතොස අලෙවි ජාලය ඔස්සේ බෙදාහැරීමටත්, ඒ තුලින් සහල් වෙළඳපළ සහ මිල රජය වෙනුවෙන් පාලනය කළ හැකි හස්තය බවට පත්වීමටත් අපේක්ෂිතය.

**2010/12/31 දිනට සේවක සංඛ්‍යාවේ විශ්ලේෂණය මෙසේය.**

| | | |
|---|---|---|
| 1. | විධායක | - 05 |
| 2. | ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි | - 50 |
| 3. | වෙනත් සහායක ශ්‍රේණි | - 195 |

## 03. කාර්‍ය සාධනය හා ව්‍යාපාරික කටයුතු පිළිබඳ සමාලෝචනය-

### i. වෙළඳාම තුළින් උපයන ලද ආදායම් තත්වය-

| | රුපියල් මිලියන | |
|---|---|---|
| | 2009 වර්ෂය | 2010 වර්ෂය |
| වෙළඳ පිරිවැටුම | 60 | 185 |
| දළ ලාභය | (1.1) | 1.9 |
| දළ ලාභ ප්‍රතිශතය | (1.8%) | 1.02% |

### ii. වෙනත් ප්‍රධාන ආදායම් ප්‍රභවයන්

| | 2010 වර්ෂය<br>රුපියල් මිලියන |
|---|---|
| ගොඩනැගිලි කුලී ආදයම් | -100,588,457.00 |
| ප්‍රවාහන ගාස්තු ආදායම් | - 10,397,838.00 |
| අකර්මන්‍ය වත්කම් විකිණීමෙන් | - 30,709,278.00 |
| ආරක්ෂක සේවා සැපයීම<br>වෙනත් ආදායම් | } 39,687,464.00 |

**ගොඩනැගිලි කුලී ආදායම්.**

සතොස සතුව තිබූ නිශ්කාර්ය පරිශ්‍රයන් සහ වෙළඳසැල් රාජ්‍ය සහ පෞද්ගලික අංශ වෙත කුලියට ලබාදීම තුළින් මාසික වේතන සහ අනෙකුත් පොදු කාර්‍ය පිරිවැය ආවරණය කර ගැනීම පිණිස ප්‍රමානවත් අරමුදල් උත්පාධනය කර ගෙන ඇත.

**ප්‍රවාහන ගාස්තු ආදායම්.**

ප්‍රවාහන අංශය සතුව තිබූ ලොරි රථ සහ වෑන් රථ කිහිපයක් වෙළඳ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ලක් සතොස අයතනයට කුලියට ලබාදීම තුළින් ප්‍රවාහන අංශයේ පොදු කාර්ය පිරිවැය සඳහා අවශ්‍ය අතිරේක ආදායමක් උත්පාදනය කරගෙන ඇත.

**සහල් නිෂ්පාදන කටයුතු**

| | |
|---|---|
| නිෂ්පාදනය සඳහා යෙදවූ වී ප්‍රමාණය | - කිලෝ. 848,001 |
| සහල් නිෂ්පාදනය | - කිලෝ. 634,629 |

## ෆාම් ෂොප් අලෙවිසැල්

2010 වසර අවසන් කාර්තුවේදී පමණ වෙළඳපලෙහි කුකුල් මස් සහ බිත්තර මිල මට්ටම් සීග්‍රයෙන් ඉහල ගිය අවස්ථාවේ දී එය පාලනය කර ගැනීම සඳහා රජය වෙනුවෙන් මැදිහත් වී නාරාහේන්පිට, රත්මලාන, පිළියන්දල ආර්ථික මධ්‍යස්ථාන වල සහ වැලිසර සහ මාලිගාවත්ත සතොස ගබඩා සංකීර්ණයන්හි ෆාම් ෂොප් අලෙවිසැල් ආරම්භ කරන ලදී. ඒ තුලින් පාරිභෝගික ජනතාවට සහන මිලකට බිත්තර සහ කුකුල් මස් මිලදී ගැනීමට අවස්ථාව සැලසුණ අතර, වෙළඳපලෙහි මිල මට්ටම් අවම කර ගැනීමටත්, ආයතනයට සාධාරණ ලාභයක් ඉපයීමටත් අවස්ථාව සැලසුණි. මෙහි දී වඩාත් වැදගත් වනුයේ නාගරික පාරිභෝගික ජනතාවට සහ දේශීය කුකුළු ගොවිපල හිමියන්ට සහ බිත්තර නිෂ්පාදකයින්ට සතොස මගින් ලබාදුන් සමාජයීය ප්‍රතිලාභයයි.

## ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම-

## ආයතනයට එරෙහිව පැවති නඩු වල තත්වය

| | 2010/01/01 දිනට පැවති නඩු | 2010 වර්ෂය තුලදී අවසන් කළ නඩු | තවදුරටත් විභාග වන නඩු |
|---|---|---|---|
| ඉහල උසාවිය | 19 | 09 | 10 |
| දිස්ත්‍රික් උසාවි | 10 | - | 10 |
| මහේස්ත්‍රාත් උසාවි | 11 | 05 | 06 |
| කම්කරු විනිශ්චය සභා නඩු | 14 | 04 | 10 |
| කම්කරු පරීක්ෂණ | 07 | - | 07 |
| බේරුම්කරණ නඩු | 04 | 02 | 02 |
| බහා තැබූ නඩු | 10 | - | 10 |
| අභියාචනා නඩු | 01 | - | 01 |

## ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්-

සතොස වෙත ලැබියයුතු ණය ශේෂ සහ සතොස විසින් ගෙවිය යුතුව ඇති බවට සඳහන් ශේෂ වටිනාකම රුපියල් මිලියන 500 ඉක්මවන අතර, මෙම ණය නෛතිකව කාලාවරෝධනය වී ඇත. විගණකවරුන් විසින් ඔවුන්ගේ වාර්තා වල මේ පිළිබඳව අහිතකර ප්‍රකාශයන් නැවත නැවත සඳහන් කර ඇති බැවින්, ඉදිරියේ දී මෙම පැරණි ණය ශේෂයන් සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළයුතුව ඇත.

## 04. සංචිත-

## ප්‍රාග්ධන සහ සංචිත

| | රුපියල් |
|---|---|
| ප්‍රාග්ධනය | - 1,056,590.00 |
| සංචිත | - 427,211,894.00 |
| වාහන ප්‍රතිසම්පාදන සංචිතය | - 72,218,000.00 |
| ප්‍රත්‍යගණන අතිරික්තය | -1,201,386,008.00 |
| ප්‍රතිව්‍යුහගත කිරීමේ සංචිතය | -4,320,364,258.00 |
| සමුච්චිත ලාභය/(පාඩුව) | -(9,264,271,758.00) |
| | (3,242,035,008.00) |

05. **අඛණ්ඩ පැවැත්මේ සංකල්පය**

පෙර පැවති රුපියල් මිලියන 8885 ක් වූ සමුච්චිත පාඩු සහ රුපියල් මිලියන 864 ක් වූ කාරක ප්‍රාග්ධන ඌනතා හේතුවෙන් සතොස ආයතනයට ණය දෙන ආයතන වලින් මූල්‍ය සහායන් ලබාගැනීමට නොහැකි විය. මෙම තත්වය යටතේ පෙර පැවති මූල්‍ය බැරකම් දැරීමට ආයතනයට හැකියාවක් නැත. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුලදී සතොස සතුව තිබූ අක්‍රියව පැවති ගොඩනැගිලි කුලියට දීමට කටයුතු කිරීමෙන් සහ අක්‍රියව තිබූ වත්කම් ඉවත් කිරීමට කටයුතු කිරීමෙන් වර්තමාන කාරක ප්‍රාග්ධනය සඳහා අවශ්‍ය කරණු ලැබූ අතිරේක මුදල් උත්පාදනය කරගෙන ඇත. එබැවින්, අධ්‍යක්ෂ මණ්ඩල මතය වනුයේ ආයතනයේ වෙළඳ ක්‍රියාකාරකම් අඛණ්ඩව පැහැදිළිව පෙණෙන ඉදිරි කාලයක් තුල පවත්වාගෙන යන බව සහ එහි වර්තමාන මූල්‍ය වගකීම් මෙම මූල්‍ය වාර්තා අත්සන් තබනු ලබන දිනයේ සිට අඩුම වශයෙන් මාස 12 ක කාලසීමාවක් තුල නියමිත දින වලදී අඛණ්ඩව දරණ බැවින් ආයතනයේ මූල්‍ය වාර්තා අඛණ්ඩව පැවැත්මේ සංකල්පය මත සකස් කිරීම වඩාත් උචිත බවය.

06. **විගණනවරුන්-**

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 154 (01) වගන්තිය සමඟ කියවියයුතු 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(01) වගන්තිය ප්‍රකාරව ආයතනයේ විගණක වියයුත්තේ රජයේ විගණකාධිපතිය.

07. **ස්තුතිය**


සතොස ආයතනයට අගනා මගපෙන්වීම සහ සහය ලබාදීම සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමාට, ගරු අග්‍රාමාත්‍යතුමාට, සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ ගරු අමාත්‍යතුමාට, ගරු, නියෝජ්‍ය ඇමතිතුමාට, ලේකම්වරුන්ට, අතිරේක ලේකම්වරුන්ට, සහ අමාත්‍යාංශ වල සියළුම නිලධාරී මහතුන්ට ස්තුතිවන්ත වෙමු. තවද, වර්ෂය තුල අපට සහයෝගය ලබාදුන් මුදල් අමාත්‍යාංශයේ, භාණ්ඩාගාරය සහ අනෙකුත් අමාත්‍යාංශ වල සියළු කාර්‍යමණ්ඩලිකයන්ටද අපි ස්තුති වන්ත වෙමු.

අපගේ වඩාත්ම වැදගත් සම්පත අපගේ කාර්‍ය මණ්ඩලයයි. ගත වූ වර්ෂය පුරා ඉටු කළ සේවාව සහ දැක් වූ සහයෝගය පිළිබඳව සියළු සේවක සේවිකාවන්ට අපි ස්තුතිවන්ත වෙමු.

අප වෙත අඛණ්ඩ අනුග්‍රහයක් දැක්වූ අගනා පාරිභෝගික ජනතාව වෙත අධ්‍යක්ෂ මණ්ඩලය සිය ස්තුතිය පුදකර සිටී. තවද, විවිධ ව්‍යවස්ථාපිත ආයතන වලටද, පුද්ගලික අංශයේ ආයතනයන්ටද, අපේ බැංකුකරුවන් වෙතද, අපගේ ස්තුතිය හිමිවේ.

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

## 2010.12.31 දිනෙන් අවසන් වසර සඳහා වෙළඳ හා ලාභ අලාභ ගිනුම

| | සටහන | වර්ෂය 2010 රු | වර්ෂය 2009 රු |
|---|---|---|---|
| පිරිවැටුම : | | | |
| සාමාන්‍ය වෙළඳ කටයුතු | 2 | 185,605,726 | 60,220,332 |
| පිරිවැටුමම් බදු | | (2,784,086) | (953,305) |
| ශුද්ධ පිරිවැටුම් | | **182,821,640** | **59,267,027** |
| දළ ලාභය / (පාඩුව) | | | |
| සාමාන්‍ය වෙළඳ කටයුතු | 2 | 1,993,882 | (1,132,039) |
| මුලු දළ ලාභය / (පාඩුව) | | 1,993,882 | (1,132,039) |
| පරිපාලන, විකුණුම් හා බෙදාහැරීමේ වියදම | 3අ සහ 3ආ | (165,319,509) | (170,745,445) |
| වෙළඳ ලාභය / (පාඩුව) | | (163,325,627) | (171,877,484) |
| බැංකු පොලී | | (21,000,000) | (23,840,131) |
| මෙහෙයුම් ලාභය / (පාඩුව) | | (184,325,627) | (195,717,615) |
| වෙනත් ආදායම් | 4 | 186,625,740 | 241,718,501 |
| | | 2,300,113 | 46,000,886 |
| මෙහෙයුම් තුළින් ලද ලාභය/(පාඩුව) | | 2,300,113 | 46,000,886 |
| අඩුකලා : පූර්ව වර්ෂයේ ගැලපීම් | | - | (433,650,657) |
| අතිවිශේෂ අයිතමයන් | 4අ | (381,412,591) | |
| බදු පෙර ශුද්ධ ලාභය /(පාඩුව) | | **(379,112,478)** | **(387,649,771)** |
| බදු ගෙවීම් | | | |
| බදු පසු ශුද්ධ ලාභය /(පාඩුව) | | (379,112,478) | (387,649,771) |
| එකතු කලා : ඉ/ගෙ ලාභය / (පාඩුව) | | (8,885,159,280) | (8,497,509,509) |
| ප/ගෙ ඉතිරි ලාභය / (පාඩුව) | | **(9,264,271,758)** | **(8,885,159,280)** |

සමුපකාර තොග වෙළඳ සංස්ථාව

| 2010.12.31 දිනට ශේෂ පත්‍රය | සටහන | වර්ෂය 2010 රු | වර්ෂය 2009 රු |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, යන්ත්‍රාගාර, උපකරණ | 5 | 1,110,517,321 | 1,127,018,147 |
| ආයෝජන | 6 | 181,852,410 | 181,852,410 |
| | | 1,292,369,731 | 1,308,870,557 |
| | | - | - |
| ජංගම වත්කම් | | | |
| තොග ගබඩා සහ නොනිමි වැඩ | 8 | 110,518,117 | 29,942,699 |
| ණය ගැතියෝ, පූර්ව ගෙවීම් සහ තැන්පත් (අඩුකළා: ප්‍රතිපාදන) | 9 | 444,050,276 | 745,821,479 |
| අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල් | 10 | 61,357,878 | 72,814,908 |
| | | 615,926,271 | 848,579,086 |
| මුළු වත්කම් | | 1,908,296,002 | 2,157,449,643 |
| හිමිකම් සහ වගකීම් | | | |
| ප්‍රාග්ධනය හා සංචිත | | | |
| ප්‍රාග්ධනය | | 1,056,590 | 1,056,590 |
| සංචිත | 11 | 427,211,894 | 427,211,894 |
| වාහන ප්‍රතිසම්පාදන සංචිතය | | 72,218,000 | 72,218,000 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 1,201,386,008 | 1,201,386,008 |
| ප්‍රතිව්‍යුහ ගත කිරීමේ සංචිතය | 7 | 4,320,364,258 | 3,616,293,377 |
| සමුච්චිත ලාභය / (පාඩුව) | | (9,264,271,758) | (8,885,159,280) |
| | | (3,242,035,008) | (3,566,993,411) |
| ජංගම නොවන වගකීම් | | | |
| දිගු කාලීන වගකීම් | 12 | 3,827,326,333 | 3,989,232,717 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම | 14 | 26,193,505 | 22,314,963 |
| | | 3,853,519,838 | 4,011,547,680 |
| ජංගම වගකීම් | | | |
| | 15 | | |
| කෙටිකාලීන ණය ගැනීම් සහ වර්තමාන ණය පොලිය | | 209,231,254 | 204,003,057 |
| ණය හිමියෝ සහ උපචිත වියදම් | 13 | 1,086,094,000 | 1,485,637,273 |
| බැංකු අයිරාව | 16 | 1,485,919 | 23,255,044 |
| | | 1,296,811,172 | 1,712,895,374 |
| මුළු හිමිකම් සහ වගකීම් | | 1,908,296,002 | 2,157,449,643 |

25.02.2011

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල වැදගත් අංගයක් විදහා දක්වයි.මෙම මූල්‍ය ප්‍රකාශන 2011.02.25 දින අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

සභාපති

මූල්‍ය කළමනාකරු

| 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය | වර්ෂය 2010 රු | වර්ෂය 2009 රු |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහ** | | |
| *බදු අයකිරීමට පෙර ශුද්ධ ලාභය / (පාඩුව) සහ අතිවිශේෂ අයිතම | (379,112,478) | (387,649,771) |
| ගැලපීම් : | | |
| ක්ෂය ප්‍රතිපාදන | 19,576,219 | 20,039,282 |
| කපා හල ආයෝජන | | |
| ස්ථාවර වත්කම් විකිණීම මත ලාභය (පාඩුව) | (30,709,278) | (113,264,795) |
| පාර්තෝෂික සඳහා වෙන් කිරීම් | 4,781,414 | 4,351,087 |
| අඩමාණ ණය වෙන්කිරීම් | 542,164,547 | |
| කාර්ක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය | **156,700,424** | **(476,524,197)** |
| තොග වැඩිවීම / (අඩුවීම) | (80,575,418) | 28,241,352 |
| ණය ගැතියෝ වැඩිවීම / (අඩුවීම) | 301,771,203 | 334,118,836 |
| ගෙවිය යුතු වියදම් වැඩිවීම / (අඩුවීම) | (444,315,076) | 14,166,929 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් | **(66,418,867)** | **(99,997,080)** |
| ගෙවූ පාර්තෝෂික | (902,870) | (2,408,305) |
| මෙහෙයුම් කටයුතු වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහ | **67,321,737** | **(102,405,385)** |
| ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහ | | |
| **ස්ථාවර වත්කම්** | | |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් | 30,554,635 | 171,793,733 |
| ස්ථාවර තැන්පතු වැඩවීම / (අඩුවීම) | - | 21,725,214 |
| ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම | (2,920,801.00) | |
| ආයෝජන කටයුතු සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් | **27,633,834** | **193,518,947** |
| මූල්‍ය කටයුතු තුලින් ජනිත වූ මුදල් ප්‍රවාහ | | |
| ණය ආපසු ගෙවීම් | | (5,228,198) |
| කෙටිකාලීන ණය ගැනීම් ඉහළ යාම | 50,000,000 | - |
| මූල්‍ය කටයුතු සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් | - | - |
| සංචිත වල ඉහළ යාම | | |
| මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වශයෙන් සංචලනය වීම | **10,312,097** | **85,885,364** |
| මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වශයෙන් ඉහළ යාම | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 49,559,864 | (36,325,500) |
| දෙසැම්බර් 31 දිනට ශේෂය | 59,871,961 | 49,559,864 |
| | **10,312,097** | **85,885,364** |

සමුපකාර තොග වෙළඳ සංස්ථාව

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | පොදු සංචිත | ණය බේරුම් කිරීමේ සංචිත | වාහන ප්‍රතිසම්පාදන සංචිත | ප්‍රත්‍යාගණන අතිරික්තය | ප්‍රතිව්‍යුහ ගත කිරීමේ සංචිත | සමුච්චිත පාඩුව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2002.01.01 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,159,246,538 | - | (4,054,023,763) | (2,394,290,747) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ පාඩුව | | | | | | | | (1,640,682,626) | (1,640,682,626) |
| 2002.12.31 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,159,246,538 | - | (5,694,706,391) | (4,034,973,369) |
| 2003.01.01 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,159,246,538 | - | (5,694,706,392) | (4,034,973,370) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ පාඩුව | | | | | | | | (1,162,050,602) | (1,162,050,602) |
| 2003.12.31 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,159,246,538 | - | (6,856,756,994) | (5,197,023,972) |
| 2004.01.01 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,159,246,538 | - | (6,856,756,994) | (5,197,023,972) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ පාඩුව | | | | | | | | (970,929,555) | (970,929,555) |
| 2004.12.31 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,159,246,538 | - | (7,827,686,549) | (6,167,953,527) |
| 2005.01.01 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,159,246,538 | - | (7,827,686,548) | (6,167,953,526) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ පාඩුව | | | | | | | | (164,723,497) | (164,723,497) |
| 2005.12.31 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,159,246,538 | - | (7,992,410,045) | (6,332,677,023) |
| 2006.01.01 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,159,246,538 | - | (7,992,410,045) | (6,332,677,023) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ පාඩුව | | | | | | | | (556,539,593) | (556,539,593) |
| 2006.12.31 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,159,246,538 | - | (8,548,949,638) | (6,889,216,616) |
| 2007.01.01 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,159,246,538 | - | (8,548,949,638) | (6,889,216,616) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ පාඩුව | | | | | | | | (4,854,299) | (4,854,299) |
| වර්ෂය තුළ සිදු වූ වෙනස්කම් | | | | | | 35,947,000 | | | 35,947,000 |
| 2007.12.31 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,195,193,538 | - | (8,553,803,937) | (6,858,123,915) |
| 2008.01.01 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,195,193,538 | - | (8,553,803,937) | (6,858,123,915) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය/පාඩුව | | | | | | | | 56,294,429 | 56,294,429 |
| විහිදුත් කළ වටිනාකම | | | | | | | 2,321,042,705 | | 2,321,042,705 |
| 2008.12.31 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,195,193,538 | 2,321,042,705 | (8,497,509,508) | (4,480,786,782) |
| 2009.01.01 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,195,193,538 | 2,321,042,705 | (8,497,509,508) | (4,480,786,781) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය /(පාඩුව) | | | | | | | | (387,649,771) | (387,649,771) |
| විහිදුත් කළ වටිනාකම | | | | | | 6,192,470 | 1,295,250,672 | | 1,301,443,142 |
| 2009.12.31 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,201,386,008 | 3,616,293,377 | (8,885,159,279) | (3,566,993,410) |
| 2010.01.01 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,603.7900 | 72,218,000 | 1,201,386,008 | 3,616,293,377 | (8,885,159,279) | (3,566,993,410) |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය /(පාඩුව) | | | | | | | | (379,112,478) | (379,112,478) |
| විහිදුත් කළ වටිනාකම | | | | | | | 704,070,881 | | 704,070,881 |
| 2010.12.31 දිනට ශේෂය | 1,056,590 | 32,444,879 | 94,477,411 | 300,289,604 | 72,218,000 | 1,201,386,008 | 4,320,364,258 | (9,264,271,757) | (3,242,035,007) |

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

2012.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සටහන්

---

සටහන 1 :

මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති :

ආ) අඛණ්ඩ පැවැත්ම

පසුගිය කාල වකවානුව තුළදී ආයතනය සැලකිය යුතු තරමේ සමුච්චිත පාඩුවක් දැරූ අතර, ශේෂ පත්‍ර දිනට එහි ජංගම වගකීම් ප්‍රමාණය ජංගම වත්කම් වලට වඩා රු. මිලියන 680 කින් ඉහළ ගොස් පැවතුණි. තවද අයිරා ණය හේතුවෙන් බැංකු ආයතන වෙතින් මූල්‍යාධාර ලබාගැනීමටද ආයතනය අපොහොසත් විය. කෙසේ වුවද, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී ආයතනය සමූපකාර සමිති සහ පුද්ගලික අංශයේ ව්‍යාපාර කිහිපයක් සමඟ තොග වෙළඳ කටයුතු සිදු කළ අතර, නිෂ්කාර්ය දේපළ අපහරණය මගින් ලත් මුදල් සහ සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමූපකාර රෙජිස්ට්‍රාර්වරයා විසින් ප්‍රදානය කරන ලද රු. මිලියන 50 ක මුදල් උපයෝගී කර ගනිමින් සියලුම ප්‍රසම්පාදන කටයුතු සඳහා මුදල් ගෙවා ඇත. ඒ අනුව ආයතනය සිය ක්‍රියාකාරී පැවැත්ම නුදුරු අනාගතයේදී අඛණ්ඩව සිදු කරගෙන යනු ලබන බවටත්, මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් තබන දින සිට අඩු තරමින් මාස 12 ක කාළය ඇතුළත ඇති විය හැකි මූල්‍ය බැඳීම් සාක්ෂාත් කරගැනීම සිදු කරනු ලබන බවටත් එලදායී ව්‍යාපාර සංකල්පය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම යෝග්‍ය බවත් අධ්‍යක්ෂවරුන්ගේ මතය විය.

ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් නියම කර ඇති ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට ඇත. තක්සේරු වටිනාකම් මත අගයකර ඇති සමහර වත්කම් හැරුණු විට මෙම ගිණුම් සඳහා බලපාන උද්ධමනීය සාධක සම්බන්ධයෙන් ගැලපුම් කොට නොමැත.

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශයක් පහතින් දැක්වේ.

ඇ) <u>ස්ථාවර වත්කම් හා ක්ෂය අනුපාත</u>

<u>ස්ථාවර වත්කම්</u>

I. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හෝ සමුච්චිත ක්ෂය අඩුකළ වටිනාකම් මත ගිනුම්ගත කොට ඇත.

II. සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි, 1997 දෙසැම්බර් 31 දින සිට ක්‍රියාත්මක වන පරිදි විවෘත වෙළඳපල වටිනාකම් මත ප්‍රත්‍යාගණනය කොට ඇත. ස්වාධීන තක්සේරුකරුවන් මගින් තක්සේරුව සිදු කරන අතර, රු. 1,159,246,538 ක අතිරික්තය, ප්‍රත්‍යාගණන අතිරික්ත ගිනුමට මාරු කොට ඇත.

III. පිළිවෙලින් 2009.12.31 දින සිට සහ 2010.12.31 දිනෙන් ක්‍රියාත්මක වන පරිදි රථවාහන විවෘත වෙළඳපල අනුපාත මත ප්‍රත්‍යාගණනය කොට ඇත. ස්වාධීන තක්සේරුකරුවන් මගින් තක්සේරුව සිදු කරන අතර, රු. 6,192,470 /- ක අතිරික්තය ප්‍රත්‍යාගණන අතිරික්ත ගිනුමට මාරු කොට ඇත.

IV. අත්පත්කර ගැනීම හෝ ඉදිකිරීමට අනුෂාංගික වන වියදම් ද ඇතුළත්ව, මිලදීගත් වටිනාකම හෝ ඉදිකිරීම් පිරිවැය මත අනෙකුත් සියලුම ස්ථාවර වත්කම් ගිණුම් ගත කොට ඇත.

## ක්ෂය වෙන් කිරීම :-

(i) මිලදී ගත් වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සිට හෝ අදාළ වත්කමෙහි ඉදිකිරීම් කටයුතු නිමකළ වර්ෂයේ සිට ක්ෂය සඳහා ප්‍රතිපාදන සලසනු ලබන අතර වත්කමෙහි ස්වභාවය පදනම් කර ගනිමින් එහි අපේක්ෂිත ආයු කාලයට අනුරූප වන පරිදි ද ක්ෂය ප්‍රතිපාදන සලසනු ලැබේ.

(ii) වත්කම්වල අපේක්ෂිත ආයු කාලය මත පදනම්ව සරල මාර්ග ක්‍රමය මත ක්ෂය ප්‍රතිපාදන සලසනු ලැබේ. පහත සඳහන් අයිතිමයන් වෙත සලසා ඇති ක්ෂය අනුපාත පහතින් සඳහන් වේ.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | 5% | පරිගණක හා උපාංග | 33 1/3% |
| යන්ත්‍රාගාර හා උපකරණ | 10% | ගබඩා උපකරණ | 10% |
| රථවාහන | 20% | අනෙකුත් උපකරණ | 10% |
| ලී බඩු හා උපාංග | 33 1/3% | මෙවලම් | 10% |
| කාර්යාල උපකරණ | 10% | | |

(ඇ) **තොග** :-

භෞතික සත්‍යාපනය මත තොග නිශ්චය කර ඇති අතර මිලදී ගත් වටිනාකම හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකම් දෙකෙන් අඩු අගය පදනම් ක ගනිමින් රු. 110,518,117/- ක වටිනාකමක් සඳහා තොග අගය කොට ඇත.

මිලදීගත් පිරිවැයට මිලදීගත් වටිනාකම, ආනයන බදු හා අනෙකුත් බදු ඇතුළත් වන අතර භාණ්ඩ අත්පත් කර ගැනීම සඳහා ප්‍රවාහන, මෙහෙයුම් සහ අනෙකුත් පිරිවැය සෘජුවම දායක වේ.

2010.12.31 දිනට වී අලෙවි මණ්ඩලයට අයත් රු. 2,084,171/- ක් වටිනා වී තොග 61,589 Kg ක් සහ රු. 22,306,621/- ක් වටිනා සහල් තොග 441,412 Kg ක් සතොස සතුව පැවතුනි.

(ඉ) **ණයගැතියෝ** :-

ඇස්තමේන්තුගත උපලබ්ධි අගය මත ණයගැතියෝ ගිණුම් ගත කොට ඇත. බොල්ණය සහ අඩමාන ණය සඳහා ණයගැතියන් මත 10% ක ප්‍රතිපාදන සලසා ඇති අතර අයකර ගත නොහැකි ණය සඳහා පූර්ණ වශයෙන් (විශේෂිත) ප්‍රතිපාදන සලසා ඇත.

මිලදී ගැනීමේ ගිවිසුමේ 6.2(ඇ) වගන්තිය ප්‍රකාර ප්‍රතිව්‍යුහගත කිරීමේ ගණුදෙනු කපාහැරීමෙන් අනතුරුව ගැලපුම් කිරීමෙන් පසුව 2003.12.31 දිනට සතොස රිමේල් ලිමිටඩ්හි ජංගම ගිණුමේ ශේෂය රු.381,412,591/-

(ඊ) **ආදායම හඳුනාගැනීම** :-

ඉන්වොයිස් කරනු ලබන අවස්ථාවේදී ආදායම හඳුනාගැනේ.

(උ) **ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කටයුතු** :-

ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කටයුතු, ජෙනරල් ට්‍රේඩිං - මෙහෙයුම් ගිණුමට ඒකාබද්ධ කොට ඇත.

(ඌ) **ආන්තික ප්‍රතිලාභ** :-

සුදුසුකම්ලත් සියලුම සේවකයන් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදන සලසා ඇත. ආයතනයේ වසර 5 ක අඛණ්ඩව සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සේවකයින් මෙම ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි. මෙම වගකීම සඳහා බාහිරින් අරමුදල් සැපයීම හෝ ආයුගණක ලෙස ඇගයීම සිදුකොට නොමැත.

(එ) **ආයෝජන** :-

මුද්‍රණ හා ගැෆික්කරණය පිළිබඳ ඉන්ග්‍රීන් ආයතනය සහ සතොස රිමේල් ලිමිටඩ් මත සිදුකළ ආයෝජනයන් පිරිවැය මත අගය කොට ඇත.

සටහන : 2

සාමාන්‍ය වෙළඳ කටයුතු ගිණුම

| | වර්ෂය 2010 රු | වර්ෂය 2009 රු |
|---|---|---|
| දළ විකුණුම් | 185,605,726 | 60,220,332 |
| පිරිවැටුම් බදු | (2,784,086) | (953,305) |
| | **182,821,640** | **59,267,027** |
| විකුණුම් පිරිවැය | 180,827,758 | 60,399,065 |
| දළ ලාභය | 1,993,882 | (1,132,039) |
| මුළු දායකත්වය | 1,993,882 | (1,132,039) |
| පරිපාලන වියදම් | (78,857,485) | (77,780,154) |
| විකුණුම් සහ බෙදාහැරීමේ වියදම් | (86,462,024) | (92,965,291) |
| බැංකු පොලිය | (21,000,000) | (23,840,131) |
| | (186,319,509) | (194,585,576) |
| වෙනත් ආදායම් | 186,625,740 | 241,718,501 |
| **ශුද්ධ ලාභය / (පාඩුව)** | **2,300,113** | **46,000,886** |

සටහන 3 අ : පරිපාලන වියදම්

| | වර්ෂය 2010 රු | වර්ෂය 2009 රු |
|---|---|---|
| අධ්‍යක්ෂක ගාස්තු | 648,275 | 884,348 |
| සේවක පඩිනඩි | 34,540,779 | 31,470,881 |
| සේවක අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල | 3,049,950 | 3,081,874 |
| ප්‍රසාද මුදල් | 111,500 | 105,400 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 2,390,707 | 2,175,544 |
| සේවක මණ්ඩල සුභසාධනය | 731,264 | 694,555 |
| කුලී, වරිපනම් හා බදු | 2,216,599 | 3,694,044 |
| විදුලිය | 6,226,896 | 6,328,882 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 200,645 | 130,555 |
| රක්ෂණය | 252,550 | 133,851 |
| තැපැල් හා දුරකථන ගාස්තු | 472,331 | 491,029 |
| ප්‍රචාරණය | 104,780 | - |
| ගමන් වියදම් හා යැපුම් දීමනා, මෝටර් රථ ධාවන වියදම් | 3,967,908 | 3,931,512 |
| අළුත්වැඩියා සහ නඩත්තු | 8,330,387 | 5,899,292 |
| විවිධ වියදම් | 2,877,377 | 3,981,330 |
| වෘත්තීය ගාස්තු | 134,738 | 214,592 |
| අමාත්‍යංශ වියදම් | | 200,000 |
| විගණන ගාස්තු | 800,000 | 800,000 |
| නීති වියදම් | 1,393,797 | 2,673,470 |
| ක්ෂය ප්‍රතිපාදන | 9,788,111 | 10,019,641 |
| සේවක වන්දි | 618,890 | 869,356 |
| | 78,857,485 | 77,780,154 |

| සටහන 3 ආ : විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | වර්ෂය 2010 රු | වර්ෂය 2009 රු |
|---|---|---|
| සේවක පඩිනඩි | 34,540,779 | 31,470,881 |
| සේවක අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල | 3,049,950 | 3,081,874 |
| ප්‍රසාද මුදල් | 111,500 | 105,400 |
| පාර්තෝෂික සඳහා ප්‍රතිපාදන | 2,390,707 | 2,175,544 |
| සේවක මණ්ඩල සුභසාධනය | 731,264 | 694,555 |
| ගමන් වියදම්, යැපුම් දීමනා, මෝටර් රථ ධාවන වියදම් | 3,980,408 | 3,931,512 |
| කුලී, වරිපනම් සහ බදු | 3,454,099 | 3,694,044 |
| තැපැලු, විදුලි පණිවුඩ සහ දුරකථන | 472,331 | 491,029 |
| විවිධ වියදම් | 2,877,377 | 3,981,330 |
| මිල අඩු කළ තොග සම්බන්ධයෙන් ලාභය/ (පාඩුව) | 28,418 | (11,380) |
| විදුලිය | 6,226,895.78 | 6,328,882 |
| ප්‍රචාරණය සහ විකුණුම් ප්‍රවර්ධනය | 104,780 | 169,288 |
| මුද්‍රණ සහ ලිපිද්‍රව්‍ය | 200,645 | 130,555 |
| ක්ෂය ප්‍රතිපාදන | 9,788,111 | 10,019,641 |
| අළුත්වැඩියා සහ නඩත්තු | 8,330,387 | 2,352,760 |
| අඩමාන සහ බොල් ණය සඳහා වෙන්කිරීම් | 8,630,612 | 22,592,367 |
| වෘත්තීය ගාස්තු | 134,738 | 214,592 |
| රක්ෂණය | 252,550 | 443,792 |
| බලපත්‍ර ගාස්තු | 537,582 | 229,271 |
| සේවක වන්දි | 618,890 | 869,356 |
| | **86,462,024** | **92,965,291** |

| සටහන 4 : වෙනත් ආදායම් | 2010<br>රු | 2009<br>රු |
|---|---|---|
| කුලී ආදායම | 100,588,457 | 99,763,595 |
| පොලිය | 5,242,703 | 4,428,342 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභ | 30,709,278 | 119,457,253 |
| හුවමාරු වෙනස | - | 220,628 |
| ප්‍රවාහන ආදායම් | 10,397,838 | 11,577,920 |
| විවිධ ආදායම් | 39,687,464 | 6,270,763 |
| | 186,625,740 | 241,718,501 |

| සටහන 4 අ : අතිවිශේෂ අයිතමයන් | 2010<br>රු | 2009<br>රු |
|---|---|---|
| මිලදී ගැනීමේ ගිවිසුමේ 6.2 (ඇ) වගන්තය ප්‍රකාර කපා හළ ප්‍රතිව්‍යුහගත ගනුදෙනු ඇතුළත් කිරීමෙන් අනතුරුව සතොස රිටේල් ලිමිටඩ් සමඟ පවත්වාගෙන ගිය සතොස ජංගම ගිනුමේ 2003.12.31 දිනට ශේෂය | 381,412,591 | - |
| | 381,412,591 | - |

සටහන : 5

2010.12.31 දිනට ස්ථාවර වත්කම් සහ නොනිමි ප්‍රාග්ධන වැඩ

| | 2010.01.01 දිනට පිරිවැය මත ශේෂය | එකතුකිරීම 2010 | ඉවත්කිරීම 2010 | 2010.12.31 දිනට ශේෂය | ක්ෂය ප්‍රතිපාදන | | | | 2010.12.31 දිනට පොත් අගය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2010.01.01 දිනට සමුච්චිත ක්ෂය | 2010 වසර සඳහා ගාස්තු | 2010 වසර තුළ ඉවත් කිරීම් | 2010.12.31 දිනට සමුච්චිත ක්ෂය | |
| සින්නක්කර ඉඩම් | 955,510,235 | | - | 955,510,235 | - | - | - | - | 955,510,235 |
| කල්බදු ඉඩම් | 2,311,930 | | - | 2,311,930 | - | - | - | - | 2,311,930 |
| සින්නක්කර ඉඩම් මත ගොඩනැගිලි | 220,090,417 | | | 220,090,417 | 130,143,233 | 11,004,461 | - | 141,147,694 | 78,942,723 |
| කල්බදු ඉඩම් මත ගොඩනැගිලි | 2,288,203 | | - | 2,288,203 | 2,065,124 | 93,543 | - | 2,158,667 | 129,536 |
| රජයේ ඉඩම් මත ගොඩනැගිලි | 82,252,459 | | - | 82,252,459 | 46,262,971 | 3,352,740 | - | 49,615,711 | 32,636,748 |
| වොක්ෂොල් ගරාජය | 16,460,291 | | - | 16,460,291 | 10,096,685 | 823,015 | - | 10,919,699.55 | 5,540,591 |
| යන්ත්‍රාගාර සහ යන්ත්‍රසූත්‍ර | 88,163,606 | | - | 88,163,606 | 87,619,648 | 308,997 | - | 87,928,645 | 234,960 |
| මෝටර් වාහන | 39,475,999 | - | - | 39,475,999 | 4,983,200 | 2,491,600 | - | 7,474,800 | 32,001,199 |
| ලීබඩු හා කාර්යාල උපකරණ | 51,744,688 | 720,963 | 4,686,720 | 47,778,931 | 50,194,288 | 975,521 | 4,700,697 | 46,469,112 | 1,309,819 |
| පරිගණක උපාංග | 75,262,900 | 1,216,773 | 209,560 | 76,270,112.50 | 75,262,900 | 405,591 | 93,547 | 75,574,944 | 695,169 |
| ගබඩා උපකරණ | 85,530,513 | 367,260 | 35,941,966 | 49,955,807 | 85,530,512 | - | 35,941,966 | 49,588,546 | 367,261 |
| මෙවලම් උපකරණ | 44,880,291 | 615,805 | 1,567 | 45,494,529 | 44,794,827 | 120,752 | 258,258 | 44,657,321 | 837,208 |
| විලම්භිත ප්‍රාග්ධන වියදම | | | - | - | | | | - | - |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | | | - | - | | | | - | - |
| | 1,663,971,532 | 2,920,801 | 40,839,813 | 1,626,052,520 | 536,953,388 | 19,576,219 | 40,994,468 | 515,535,139 | 1,110,517,381 |

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

සටහන 6 : ආයෝජන

| | වර්ෂය 2010 රු | වර්ෂය 2009 රු |
|---|---|---|
| සී/ස සතොස මෝටර්ස් | 10 | 10 |
| මුද්‍රණ හා ග්‍රැෆික්කරණය පිළිබඳ ඉංග්‍රීන් ආයතනය | 9,923,710 | 9,923,710 |
| සතොස රිටේල් ලිමිටඩ් | 171,928,690 | 171,928,690 |
| | 181,852,410 | 181,852,410 |

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

සටහන 7 : ප්‍රතිව්‍යුහගත කිරීමේ සංචිත

| | වර්ෂය 2010 රු | වර්ෂය 2009 රු |
|---|---|---|
| ස්වයං විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය | 1,506,563,583 | 1,506,563,583 |
| TR ණය | 275,000,000 | 275,000,000 |
| බැදුම්කර පොළී | 1,996,636,128 | 1,834,729,794 |
| කපාහළ ණය හිමියන් ආදිය | 542,164,547 | |
| | 4,320,364,258 | 3,616,293,377 |

සමූපකාර තොග වෙළඳ සංස්ථාව

සටහන 8 : තොග

| | වර්ෂය 2010 රු | වර්ෂය 2009 රු |
|---|---|---|
| **පොදු වෙළඳ තොග** | | |
| තොග වෙළඳ අංශයේ තොගය | 103,559,666 | 22,984,347 |
| C සහ D පන්තියේ තොග | 28,418 | - |
| | 103,588,084 | 22,984,347 |
| භාවිතයට නුසුදුසු භාණ්ඩ සඳහා ප්‍රතිපාදන | (28,418) | - |
| | 103,559,665 | 22,984,347 |
| ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොගය | 2,360,907 | 2,360,907 |
| **වෙනත්** | | |
| ගොඩනැගිලි අංශයේ තොගය | 4,143,032 | 4,143,032 |
| අමතර කොටස් තොගය | | 454,412 |
| ඇසුරුම් ද්‍රව්‍ය | 454,512 | - |
| නිමිභාණ්ඩ, තෙල්/ වීනාකිරි තොගය - වැලිසර | | - |
| | 110,518,117 | 29,942,699 |

සටහන 09 : ණය ගැතියෝ, පූර්ව ගෙවීම් සහ තැන්පතු

| | දළ 2010 | මුලු ප්‍රතිපාදන | රු ශුද්ධ ණයගැතියෝ |
|---|---|---|---|
| **වෙළඳ ණය ගැතියෝ** | | | |
| සමුපකාර | 11,437,214 | 1,143,721 | 10,293,493 |
| රජයේ දෙපාර්තමේන්තු | 11,873,103 | 1,187,310 | 10,685,793 |
| සංස්ථා | 3,179,405 | 317,941 | 2,861,465 |
| වෙනත් ගනුදෙණුකරුවන් | 117,377,418 | 11,737,742 | 105,639,676 |
| | 143,867,140 | 14,386,713 | 129,480,427 |
| **අහරු වෙක්පත්** | | | |
| රජයේ දෙපාර්තමේන්තු | | | - |
| සමුපකාර සහ සංස්ථා | - | - | - |
| | | - | - |
| අනෙකුත් ගනුදෙණුකරුවන් | 3,830,707 | 383,071 | 3,447,636 |
| | 3,830,707 | 383,071 | 3,447,636 |
| **කුලී ණයගැතියෝ** | | | - |
| අනෙකුත් ගනුදෙණුකරුවෝ | 124,551,893 | 68,539,508 | 56,012,385 |
| | 124,551,893 | 68,539,508 | 56,012,385 |
| **උප සමාගම් සමහ ජංගම ගිණුම්** | | | |
| සතොස හෝල්සේල් ලිමිටඩ් | - | - | - |
| සතොස රිටේල් ලිමිටඩ් | 142,408,758 | 142,408,758 | - |
| සතොස සිකියුරිටි ලිමිටඩ් | 4,441,677 | 444,168 | 3,997,509 |
| සී/ස ලක් සතොස | 24,202,985 | 24,202,985 | - |
| | 171,053,420 | 167,055,911 | 3,997,509 |
| **කෙටිකාලීන ණය** | | | |
| ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 10,000,000 | | 10,000,000 |
| තැන්පතු, පූර්ව ගෙවීම් සහ අත්තිකාරම් | 31,537,005 | 3,053,701 | 28,483,304 |
| භාණ්ඩාගාරයෙන් අයවිය යුතු මුදල් | 100,000,000 | 100,000,000 | - |
| වැටුප් හා සේවක මණ්ඩල ලෙජර් පාලන ගිණුම | 4,189,707 | 418,971 | 3,770,737 |
| ලැබිය යුතු හිමිකම්පෑම | 6,932,494 | 693,249 | 6,239,245 |
| විවිධ හා අනෙකුත් ණය ගැතියෝ | 31,441,577 | 3,144,158 | 28,297,419 |
| **මුලු සාමාන්‍ය වෙළඳ ණයගැතියෝ** | 174,100,783 | 107,310,079 | 76,790,704 |
| ණය ගැතියෝ - තිර්හු පිටි ආශ්‍රිත කාර්යයන් | | | - |
| ජාතික ආරක්ෂක බදු - අත්තිකාරම් | 234,321,615 | 60,000,000 | 174,321,615 |
| | 234,321,615 | 60,000,000 | 174,321,615 |
| | 851,725,558 | 417,675,282 | 444,050,276 |

| සටහන 10 : අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් | වර්ෂය 2,010 රු | වර්ෂය 2009 රු |
|---|---|---|
| හැ.නැ.බැ ඉතිරිකිරීම් | 266,032 | 241,032 |
| සම්පත් බැංකුව යූ.පී.බී | 141,589 | 141,589 |
| තැපැල් හා සුලු මුදල් අග්‍රිමය | 2,042,553 | 2,085,998 |
| ඉතිරිකිරීම් - මහජන බැංකුව | 665 | 666 |
| දෛනික පත්‍රිකා පාලනය | 1,375,438 | (15,812,879) |
| ණය කාඩ්පත් | | 2,045,045 |
| සෙලාන් බැංකුව | 221,269 | 221,269 |
| බැංකු හුවමාරු | | - |
| විදේශ ව්‍යවහාර මුදල් - දේශීය | 2,660,872 | 2,724,677 |
| ලංකා බැංකුව | | 3,700 |
| කොමර්ෂල් බැංකුව | 54,640,071 | 81,130,969 |
| අතිරේක ණය | 32,842 | 32,842 |
| මහජන බැංකුව | | |
| ස්මාට් කාඩ් | 23,453 | - |
| | 61,357,878 | 72,814,908 |

**සටහන11 : සංචිත**

| | වර්ෂය 2,010 රු | වර්ෂය 2009 රු |
|---|---|---|
| ප්‍රාග්ධන සංචිත | 32,444,879 | 32,444,879 |
| පොදු සංචිත | 94,477,411 | 94,477,411 |
| ණය බේරුම්කිරීමේ සංචිත ගිණුම | 300,289,604 | 300,289,604 |
| | **427,211,894** | **427,211,894** |

**NOTE 12 : දිගු කාලීන වගකීම්**

| | | |
|---|---|---|
| රු. මිලියන 4397 මත ගෙවිය යුතු මුළු පොළිය ගිවිසුම ප්‍රකාර වසර 13 කට වැඩි බැඳුම්කර 09.01.01 දිනට ශේෂය | 2,266,688,626 | 3,561,939,348 |
| අඩු කළා - වර්ෂය තුළදී භාණ්ඩාගාරය විසින් ගෙවූ මුදල් | (161,906,334) | (1,295,250,672) |
| වර්ෂයට 8.5% ක වට්ටමක් මත රු. මිලියන 4397 ක බැඳුම්කර වල වර්තමාන වටිනාකම | 1,522,544,041 | 1,522,544,041 |
| | **3,627,326,333** | **3,789,232,717** |
| රු. මිලියන 200 ක වගකීම් භාණ්ඩාගාරය වෙත පහත සඳහන් පරිදි ලැබී ඇත | | |
| සතොස රිටේල් ලිමිටඩ් අලෙවියෙන් ලද මුදල් | 680,000,000 | 680,000,000 |
| සතොස රිටේල් ලිමිටඩ්හි ණය හිමියන්ට ගෙවූ මුදල් | 555,000,000 | 555,000,000 |
| HSBC,කොමර්ෂල් බැංකුවට ගෙවූ මුදල් | 200,000,000 | 200,000,000 |
| හැ.නැ.බැ.ට ගෙවූ මුදල් | 25,000,000 | 25,000,000 |
| ණය හිමියන්ට ගෙවූ මුදල් | 100,000,000 | 100,000,000 |
| ශ්‍රී ලංකා රජයට ගෙවිය යුතු මුදල් | 200,000,000 | 200,000,000 |
| | **3,827,326,333** | **3,989,232,717** |

රු. මිලියන 4397 ක් වටිනා බැඳුම්කර (අර්ධ වාර්ෂික) මත ගෙවිය යුතු ස්ථාවර පොළිය රු.මිලියන 4209 ක් වන අතර, (භාණ්ඩාගාරය මගින් 50%ක් සුරැකුම් කළ) 8.5% ක වට්ටමක් මත බැඳුම්කර වල වර්තමාන අගය දිගුකාලීන වගකීමක් ලෙස ගිණුම්ගත කොට ඇත. 2008 වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් 50%ක පොළී ප්‍රමාණය ආරම්භයේදීම සහතික කළද අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2004 මැයි 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි භාණ්ඩාගාරය විසින් සම්පූර්ණ පොළිය ගෙවීමට තීරණය කර ඇත. එම නිසා භාණ්ඩාගාරය විසින් සිදුකළ සියලුම ගෙවීම් ප්‍රතිව්‍යුහ ගත කිරීමේ සංචිත ගිණුමට මාරු කර ඇත.

**සටහන 13 : ණය හිමියන් සහ උපචිත වියදම්**

| | 2,010 රු. | 2009 රු |
|---|---|---|
| <u>සතොස</u> | | |
| වෙළඳ ණයහිමියෝ | 97,152,128 | 48,479,685 |
| ආනයන මිලදී ගැනුම් හා ගාස්තු | 221,791,461 | 278,639,036 |
| භාණ්ඩාගාරය - වී සඳහා අත්තිකාරම් | 254,149,693 | 254,149,693 |
| සේවකයන් සඳහා වැටුප් හා ගෙවිය යුතු මුදල් | 3,795,500 | 40,810,159 |
| සේවක මණ්ඩලය ඇප තැන්පතු සහ පොලිය | 2,908,539 | 2,957,156 |
| TR Lණය - මහජන බැංකුව (භාණ්ඩාගාරය මගින් සහතික කළ) | 207,050,943 | 207,050,943 |
| අනෙකුත් ණයහිමියෝ | 249,245,736 | 511,274,126 |
| | **1,036,094,000** | **1,343,360,796** |
| කෙටිකාලීන ණය | | |
| සමුපකාර කොමසාරිස් | 50,000,000 | - |
| <u>තිරිඳු පිටි ආශ්‍රිත කාර්යයන්</u> | | |
| අනෙකුත් ණය හිමියෝ | | 54,646,460 |
| රිටේල් ලිමිටඩ් වෙතින් මාරු කිරීම් | | 87,630,016 |
| | **1,086,094,000** | **1,485,637,273** |

| සටහන 14 : විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් | සතොස 2,010 රු | සතොස 2009 රු |
|---|---|---|
| 09.01.01 දිනට ශේෂය | 22,314,962 | 20,372,180 |
| වර්ෂය තුළදී ගෙවූ මුදල් | (902,870) | (2,408,305) |
| වර්ෂය සඳහා අයකළ මුදල් | 4,781,414 | 4,351,087 |
| 09.12.31 දිනට ශේෂය | **26,193,506** | **22,314,962** |
| | | |
| **සටහන 15 : බැංකු ණය** | | |
| ලංකා බැංකුව : ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් අනතුරුව ශේෂය | 100,000,000 | 100,000,000 |
| මහජන බැංකුව | 66,231,254 | 61,003,057 |
| හැටන් නැෂනල් බැංකුව | 43,000,000 | 43,000,000 |
| | **209,231,254** | **204,003,057** |
| | | |
| **සටහනE 16 : බැංකු අයිරාව** | | |
| සතොස | | |
| අතිරේක ණය | | |
| බැංකු හුවමාරු | | - |
| මහජන බැංකුව - විදේශීය ශාඛාව | | 9,596,445 |
| සම්පත් බැංකුව | | - |
| මහජන බැංකුව - නව ගිණුම 2007 | 1,243,775 | 1,243,775 |
| ඩිපෝ බැංකුව | | 10,258,045 |
| පොදු ලැබීම් පාලන ගිණුම | 242,144 | 242,144 |
| සිටි බැන්ක් | | 89,275 |
| කොමර්ෂල් බැංකුව | | 314,492 |
| | | 1,510,867 |
| | **1,485,919** | **23,255,044** |

සටහන 17 :

<u>උප සමාගම් ඒකාබද්ධ නොකිරීමට හේතු</u> :

**සතොස රිමේල් ලිමිටඩ්.**

සතොස රිමේල් ලිමිටඩ්හි කොටස්වලින් 40% ක ප්‍රමාණයක් 2003 වර්ෂයේ දී සතොස විසින් පුද්ගලික අංශයේ ව්‍යාපාරයකට අලෙවි කර ඇති අතර 2006 වර්ෂයේ ලබාදෙන ලද උසාවි නියෝගයක් මඟින් විසුරුවා හරින ලද සතොස රිමේල් ලිමිටඩ්හි ගිණුම් නොමැතිවීම හේතුවෙන් එම කාලපරිච්ඡේදය සඳහා ඒකාබද්ධ ගිණුම් පිළියෙල කොට නොමැත.

සටහන 18

<u>අවිනිශ්චිත වගකීම්</u> :-

(1) ලාභාංශ බදු වශයෙන් සැලකීම :- 1992/1993 වර්ෂ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් තක්සේරු කිරීම් නිකුත් කොට ඇත.

| | බදු (රු.) | දඩය (රු.) |
|---|---|---|
| 1992 / 1993 | 65,249,578 | 82,624,789 |

සමාලෝචන මණ්ඩලය විසින් කොමසාරිස්වරයාගේ තක්සේරුව වන Y/A92/93 අනුමත කොට ඇත. සතොස විසින් ඊට එරෙහිව අභියාචනයක් කොට ඇති අතර අදාළ නඩුව අභියාචනාධිකරණයේ විභාග වෙමින් පවතී. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මෙම නඩුව පවරමින් කියා සිටින්නේ ලාභාංශ බදු සඳහා දඩයක් නොව හිමිකම්පෑමක් පමණක් ඉල්ලා ඇති බවයි.

(2) වයස අවුරුදු 55 දී විශ්‍රාම ගත් සේවකයින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා ඇති අතර ඒ සම්බන්ධයෙන් වන අවිනිශ්චිත වගකීම රුපියල් මිලියන 3.8 කට ඇස්තමේන්තු කොට ඇත.

(3) පැරණි සේවකයන් විසින් මානව හිමිකම් කොමිසමෙහි නඩු 106 ක් ගොනු කර ඇති අතර මෙම නඩු සම්බන්ධයෙන් ඇතිවිය හැකි මූල්‍යමය බලපෑම තක්සේරු කිරීමට අපට හැකියාවක් නොමැත.

(4)

සටහන 19

<u>බදු ගෙවීම</u>

<u>ආදායම් බදු</u> :-

2000 අංක 38 දරන දේශීය ආදායම් පනත ප්‍රකාර බදු ප්‍රතිපාදන ගණනය කර ඇත. Y/A2009/2010 සහ 2010/2011 සඳහා පිළිවෙලින් රුපියල් බිලියන 9.7 හා රුපියල් බිලියන 10.3 ක ඉදිරියට ගෙන ගිය බදු අලාභ පවතින බැවින් බදු වගකීම් නොමැත.

<u>විලම්භිත බදු</u> :-

නුදුරු අනාගතයේ දී කාල ගණන වෙනස්කම්වල වෙනසක් ඇති වීමට හැකියාවක් නොමැත යන පදනම මත වත්කමෙහි කාල ගණන වෙනස්කම් මත බදු කපාහල වටිනාකමට ක්ෂය ප්‍රතිපාදන දීමනාවක් සඳහා හිමිකම් පෑමක් සිදුකර ඇති වත්කම්වල ශුද්ධ පොත් අගය අතිරික්ත වීම මත විලම්භිත බදු සඳහා ප්‍රතිපාදන සැලසීම අවශ්‍ය නොවේ.

සටහන 20

<u>සතොස රිටේල් ලිමිටඩ්</u>

2006 වර්ෂයේ ඔක්තෝබර් මස 23 දින කොළඹ දිසා අධිකරණය විසින් ලබාදුන් තීන්දුවකට අනුව සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ පරිපාලිත සමාගමක් වූ සතොස රිටේල් ලිමිටඩ් ආයතනය විසුරුවා හැර ඇති අතර ඈවර කිරීමේ ක්‍රියාපරිපාටිය තවමත් අවසන් කර නොමැත.

සටහන 21

<u>**අධ්‍යක්ෂවරුන්ගේ කොටස් අයිතිය**</u> :

අධ්‍යක්ෂවරුන් විසින් සතොස ආයතනයේ හෝ එහි පරිපාලිත සමාගම්වල කොටස් අයිතිය නොදරයි

සටහන 22

<u>**කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ අයිතිවාසිකම්**</u> :

සතොස ආයතනය සමඟ ඇති කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු වෙත කිසිදු අයිතිවාසිකමක් නොමැත.

සටහන 23

<u>**ආශ්‍රිත පාර්ශ්වකරුවන්ගේ ගණුදෙනු**</u> :

සතොස ආයතනයේ සභාපතිවරයා, සී/ස. ස්ටේට් ට්‍රේඩිං (කෝපරේටිව් හෝල්සේල්) සමාගමේ සහ සතොස ආරක්ෂක සහ සනීපාරක්ෂක සේවා (පුද්) සමාගමේ ද සභාපතිවරයා වේ. සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ දී සී/ස. ස්ටේට් ට්‍රේඩිං (කෝපරේටිව් හෝල්සේල්) සමාගම විසින් ආනයනය කළ රුපියල් මිලියන 122 ක් වටිනා භාණ්ඩ සතොස වෙත මාරු කරන ලදී.

සටහන 24

<u>**ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සිදුවීම්**</u> :

ශේෂ පත්‍රයේ සඳහන් ගණුදෙනු සඳහා බලපාන වැදගත් සිද්ධීන් කිසිවක් ශේෂ පත්‍ර දිනට පසුව සිදුවී නොමැත.

සටහන 25

<u>**මුදල් හා මුදල් සමාන දෑ**</u>

අතැති මුදල් , බැංකු සමඟ ඇති ඒක්ෂණ තැන්පතු සහ බැංකු ණය මුදල් හා මුදල් සමාන දෑ වලට ඇතුළත් වේ.

සටහන 26

<u>**දිගුකාලීන වගකීම්**</u>

ණය නිරවුල් කිරීමේ අරමුණින් 2003 දෙසැම්බර් මස ශ්‍රී ලංකා රජය විසින් අදාල බැංකු වෙත රු. මිලියන 4397 ක් වටිනා බැඳුම්කර නිකුත් කරන ලදී. 2005 වර්ෂයේදී රු. බිලියන 1.8 ක් වූ ද වර්තමාන වටිනාකම රු. මිලියන 4397 ක් ද වන වත්කම් විකුණා, භාණ්ඩාගාරය වෙත මුදල් ප්‍රේෂණය කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කමිටුව (PERC) වෙත අදාල වත්කම් භාරදෙන මෙන් සතොස වෙතින් ඉල්ලීමක් කරන ලදී. මෙම ගිවිසුම ක්‍රියාත්මක නොවූ බැවින් භාණ්ඩාගාරය වෙත ඒ පිළිබඳව දැනුම්දීමක් සිදු කොට ඇත.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / துலைவா / My No: එස්සී/ඊ/සීඩබ්ලිව්ඊ/එෆ්/ඒඑම්එන්ඩී/ඒ/2010
ඔබේ අංකය / உமது இல / No:
දිනය / திகதி / Date: 2012 ජූලි 20 දින

5095
25 JUL

සභාපති,

සමූපකාර තොග වෙළඳ සංස්ථාව.

**සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1969 අංක 12 දරන සමූපකාර තොග වෙළඳ සංස්ථා පනතේ 6 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2011 දෙසැම්බර් 21 දින සංස්ථාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මෙම වාර්තාවේ ඇතුළත් අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත්කර ඇති සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

#### 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

(අ) රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව විසින් 2011 ඔක්තෝබර් 13 දින, 2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන නැවත සකසා විගණනය වෙත ඉදිරිපත් කළ යුතු බවට සතොස සභාපතිවරයා වෙත නියෝග කර තිබුණු අතර, ඒ අනුව මූල්‍ය ප්‍රකාශන නැවත සකසා ඉදිරිපත් කර තිබුණේ 2012 ජනවාරි 05 දිනදීය.

(ආ) මූල්‍ය ප්‍රකාශන තුළ විකුණුම් පිරිවැය ඉදිරිපත් කර නොතිබුණු අතර, ප්‍රමාණවත් සටහනක් මගින් විකුණුම් පිරිවැය ගණනය කළ ආකාරය හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී.ල.ගි.ප්‍ර)

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකුල නොවූ අවස්ථා පහත දැක්වේ.

(අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 03 — සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි මහ පෙන්වීම් අනුගමනය කළයුතු බව පෙන්වා දී ඇති නමුත් සතොස ආදායම් ප්‍රකාශ සහ ශේෂ පත්‍රය එම විධිවිධාන අනුව සකස් කර ඉදිරිපත් කර නොතිබුණි. එනම්,

- විකුණුම් පිරිවැය ආදායම් ප්‍රකාශයේ මුහුණත හෙළිදරව් කර නොතිබීම
- ආදායම් ප්‍රකාශය සම්මත ආකෘතියේ ඉදිරිපත් කර නොතිබීම
- වෙනත් ආදායම් මෙහෙයුම් ප්‍රතිඵලයට පසුව ගලපා තිබීම

| | |
|---|---|
| (ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 05 | තොග හඳුනා ගැනීම, ගිණුම්ගත කිරීම හා හෙළිදරව් කිරීම සම්බන්ධ ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කර තිබුණු නමුත්, ඊට අනුකූලව කටයුතු කළ බවට තහවුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 09 හා 18 | (i) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ස්ථාවර වත්කම් විකුණුම් ලාභය රු.192,889 ක් වැඩියෙන් දක්වා තිබුණු අතර ඉදිරිපත් කරන ලද පිළිතුරු මගින් අසම්පූර්ණ හා ගිණුම්කරණ මූලධර්ම වලට පටහැනි සංඛ්‍යාත්මක සැසඳීමක් කර තිබුණි.<br><br>(ii) වෘත්තිමය සුදුසුකම් ලත් තක්සේරුකරුවෙකු විසින් ඇගයීමකින් නිශ්චය කර වත්කම් ප්‍රත්‍යාගණනය කළ යුතු අතරම ප්‍රත්‍යාගණන පදනම, ප්‍රතිසම්පාදන පිරිවැය (Replacement Cost) තීරණය කිරීමේ දර්ශක වල ස්වභාවය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතු වුවත් එම විධි විධාන වලට පටහැනිව සංස්ථාවේ ප්‍රවාහන අංශයේ කළමනාකරුගේ ඇගයීම පදනම් කර ගෙන මෝටර් රථ ප්‍රත්‍යාගණනය කර තිබුණි. |
| (ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 36 | (i) නීති වියදම් ලෙස රු.1,043,768 ක් ගෙවා තිබුණු බව නියැදි විගණනයේදී නිරීක්ෂණය වුවද, අවසන් ගිණුම් තුල නීති වියදම් ලෙස රු.1,393,797 ක් දක්වා තිබුණි. එහෙත් කළමණාකරණය විසින් 2010 වර්ෂයේ නීති වියදම් උපලේඛනයේ දක්වා ඇත්තේ රු.741,840 කි. ඒ අනුව වටිනාකම රු.651,957 වු වියදම් සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. |

(ii) සේවක අර්ථසාධක අරමුදල් නොගෙවීම මත සංස්ථාවට එරෙහිව නඩු 05 ක් පවරා එමගින් රු.3,895,235 ක් වූ වන්දි මුදලක් ඉල්ලා තිබුණි. මෙම අසම්භාව්‍ය වගකීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 18 මගින් හෙළිදරව් කර තිබුණු රු. මි. 3.8 ක් ලෙස වූ වටිනාකම විගණනය වෙත ඉදිරිපත් කල පිළිතුරේ රු.මි. 2.7 ක ඇස්තමේන්තු වටිනාකමක් ලෙස දක්වා තිබුණි. මෙම වෙනසට හේතු හා ඇස්තමේන්තු කිරීමේ පදනම විගණනය වෙත හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්වල වැඩියෙන් හා අඩුවෙන් දැක්වීම

රු.97,000 කට තක්සේරු කර තිබූ යතුරු පැදි දෙකක් හා ටේලරයක් 2010 පෙබරවාරි 01 දින විකුණා තිබුණද, ඊට අදාල රු.97,000 ක් වූ පිරිවැය වටිනාකම සහ රු.12,000 ක් වූ ක්ෂය වෙන් කිරීම් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

### 2.2.4 නොසැසඳුනු පාලන ගිණුම්

(අ) අවසන් ගිණුම් සමහ ඉදිරිපත් කළ සාරාංශගත උපලේඛනය අනුව 2009 දෙසැම්බර් 31 දිනට රු.51,744,688 ක් වූ ලී බඩු හා කාර්යාල උපකරණ වල වටිනාකම 2010 ජනවාරි 01 දින ට රු.51,937,589 ක් ලෙස දක්වා තිබුණි . එසේම, 2009 දෙසැම්බර් 31 දිනට ලී බඩු හා උපකරණ සහ ක්ෂය වෙන් කිරීම් ගිණුම් විස්තරාත්මක උපලේඛනය සහ සාරාංශගත උපලේඛනය අතර පැවති පිළිවෙලින් රු.8,211,421 හා රු.8,116,617 ක් වූ වෙනස නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් අදාල ගැලපීම් 2010 වර්ෂයේදී සිදුකළ බව කළමණාකාරීත්වය විසින් විගණනය වෙත දන්වා තිබුණද, අදාල ගැලපීම් සිදුකළ ආකාරය විගණනය වෙත තහවුරු කිරීමට කළමණාකාරීත්වය අපොහොසත් විය.

(ආ) 2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමහ ඉදිරිපත් කර තිබුණු 2009 වර්ෂයේ ගිණුම් විෂයයන් 07 ක සංසන්දනාත්මක වටිනාකම් අතර එකතුව රු. 2,268,498,943 ක වෙනසක් පැවතුණි.

(ඇ) 2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම් ශේෂ වටිනාකම් සහ ශේෂ පිරික්සුමේ දක්වා තිබුණු ගිණුම් ශේෂ වටිනාකම් සැසඳීමේදී එම ගිණුම් ශේෂ 43 ක එකතුව රු.2,838,392,254 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, පසුව එම වෙනසට හේතු විගණනය වෙත ඉදිරිපත් කර තිබුණද, එම හේතු පිළිගැනීමට ප්‍රමාණවත් තහවුරු කිරීම්, සැසඳුම් ප්‍රකාශ, උපලේඛන යනාදිය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සංස්ථාව විසින් 2010 වර්ෂයට අදාලව ප්‍රධාන ලෙජරයේ දෘඩ පිටපත (Hard Copy) විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ 2012 පෙබරවාරි 02 දින බැවින්, 2010 මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම්, ලෙජරයේ අවසන් ශේෂ හා ගනුදෙනු සමඟ සසඳා නිවැරදිතාවය සනාථ කර ගැනීමට අපහසු විය.

(ඉ) පසුව ඉදිරිපත් කළ සංශෝධිත මූල්‍ය ප්‍රකාශන සහ මුලින් ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන සමඟ දක්වා තිබූ මුළු වියදම රු. 147,358 ක් වූ වෙනසක්ද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සහ ශේෂ පත්‍රයේ දක්වා තිබූ ශේෂ 09 කට අදාලව එකතුව රු. 742,961,051 ක් වූ වෙනස්කම් ද, නිරීක්ෂණය වූ අතර, ඊට අදාල තහවුරු කිරීම් ඉදිරිපත් කර නොතිබුණි. සංශෝධිත ශේෂ පිරික්සුම පිළියෙල කිරීමේදී ගිණුම් ශේෂ 15 කට අදාලව එකතුව රු.3,117,920 ක් වෙනස් කර තිබුණු නමුත්, ඊට අදාල තහවුරු කිරීම් හා සැසඳුම් ප්‍රකාශ ද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.
තවද, සංශෝධිත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ මූල්‍ය ප්‍රතිඵලය සහ සංශෝධිත ශේෂ පිරික්සුමේ දක්වා තිබූ මූල්‍ය ප්‍රතිඵලය අතර වටිනාකම රුපියල් මිලියනයකින් වෙනස් වීමට හේතුද අදාල තහවුරු කිරීම් හා සැසඳුම් ප්‍රකාශද විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) ඉහත (අ), (ආ), (ඇ) (ඈ) හා (ඉ) අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන ගිණුම්කරණමය පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ කළමනාකාරිත්වයේ වගකීම ඉටු වී නොතිබුණි.

2.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දින වනවිට ආයතන හා පුද්ගලයන් 198 ක ගෙන් සංස්ථාවට ලැබිය යුතු කුලී වටිනාකම රු.124,551,893 ක් වූ අතර, මෙම මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියා මාර්ගයක් 2011 අප්‍රේල් මස වනවිටත් ගෙන නොතිබුණි.

(ආ) දැනට මසකට රු.75,000 ක කුලී පදනම මත සමාගමකින් ලබා ගත් ගොඩනැගිල්ලක්, සතොස විසින් උප බදු කුලී ගිවිසුමක් යටතේ මාසිකව රු.195,000 ක කුලියකට වෙනත් සමාගමකට 2005 මාර්තු 05 දින කුලියට දී තිබුණි. කුලියට ලබාගත් සමාගම වෙනුවෙන් ගෙවිය යුතු රු.75,000 බැගින් වූ වාරික අඛණ්ඩව ගෙවා තිබුණද, කුලියට දුන් සමාගමෙන් 2010 දෙසැම්බර් 31 දක්වා සංස්ථාවට රු. 4,904,250 ක් වූ කුලී ආදායමක් අයකර ගත යුතුව තිබුණි. ඉන් 2010 වර්ෂයට අදාල ප්‍රමාණය අයකර ගත් බවට විගණනය වෙත දන්වා තිබුණද, අදාල විස්තරාත්මක තහවුරු උපලේඛණ මෙතෙක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වැලිසර ගබඩා සංකීර්ණයේ පිහිටුවා ඇති ලක් සතොස වෙත පවරා දුන් එකතුව රු.126,156,746 ක් වූ වත්කම් වෙනුවෙන් කිසිදු මුදලක් 2012 ජූලි 05 තෙක් අයකරගෙන නොතිබුණි.

### 2.2.6 මුදල් හා බැංකු ශේෂ

ජංගම ගිණුම් අංක 1415160701 (ලෙජර් අංක 1545428) ට අදාලව ශේෂ පත්‍රයේ දක්වා ඇති බැංකු ශේෂය රු.16,298,762.49 ක් වුවද, බැංකු සැසඳුම් ප්‍රකාශය හා මුදල් පොත අනුව එම ශේෂය රු.12,573,250 ක් විය. ඒ අනුව, රු.3,725,511.76 ක් වූ වෙනසට හේතුව පරිගණකගත ගිණුම්කරණ පද්ධතියේ දෝෂයක් බැව් කළමණාකාරත්වය විසින් දන්වා තිබුණද, එම දෝෂය සිදුවූ ආකාරය විගණනය වෙත තහවුරු කර නොතිබුණි.

### 2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකාරත්ව තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 13(5)(ඕ) වගන්තිය | සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු 13(5)(ඕ) වගන්තිය ප්‍රකාර වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 1966 අංක 38 දරන පනතේ 03 වගන්තියෙන් සංශෝධිත 1949 අංක 47 දරන සමූපකාර තොග වෙළඳ සංස්ථා පනතේ 4 වගන්තිය | ස.තො.ස. සිය නිල මුද්‍රාව යොදා ගිවිසුමකට එළඹීමේදී සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නම් කළ අධ්‍යක්ෂකවරයෙකුද අත්සන් කළ යුතු වුවත්, සී/ස ලංකා ස.තො.ස. සමාගමට ගොඩනැගිලි කුලියට දීමේදී, ගිවිසුම් 02 ක සභාපතිවරයා අත්සන් කර නොතිබුණි. 1966 අංක 38 දරන පනතේ 3 ඡේදයට අනුකූලව ඉදිරියේදී කටයුතු කරන බව කළමනාකාරත්වය විසින් 2009 ජූලි 24 දිනැති ලිපියෙන් මා |

වෙත දන්වා තිබුණද, මෙම වාර්තාවේ දිනය දක්වා ඒ අනුව කටයුතු කළ බවට සාක්ෂි නොවීය. මෙම ගිවිසුම් දෙකට අදාල ගනුදෙනු අධ්‍යක්ෂවරු විසින් අත්සන් කර පසුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ බව සභාපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණද, අදාල තහවුරු ලේඛණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ

(i) 5.1.2 වගන්තිය

2007 සිට 2010 දක්වා කාලපරිච්ඡේදය ආවරණය වන සේ විගණනය වෙත 2009 දෙසැම්බර් 09 දින ඉදිරිපත් කර තිබුණු අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත නොකළ අවිධිමත් සංයුක්ත සැලැස්මේ 2010 වර්ෂය වෙනුවෙන් වූ අනාගත උපාය මාර්ග සැලසුම්, ඒවායේ තාත්විකභාවය, ඉලක්ක වෙත සාධාරණව යොමු වීමක් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වගකීම යනාදිය පැහැදිලිව හා නිශ්චිතව දක්වා නොතිබුණි.

(ii) 5.1.3 වගන්තිය

සංස්ථාවේ අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කළ හා යාවත්කාලීන කළ සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික අයවැය ලේඛනයක් පිළියෙල කර සෑම ගිණුම් වර්ෂයක් ආරම්භ වීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද, එම විධි විධාන ප්‍රකාරව 2010 සිට 2012 දක්වා වූ වර්ෂ වෙනුවෙන් පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික අයවැය ලේඛනයක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 5.2.2 , 8.3.2 වගන්ති හා 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පර්පාලන චක්‍රලේඛයේ 1.1.6 (v) සහ 1.3 වගන්ති සහ මු.රෙ. 1646

(i) 'යී' මට්ටමේ රාජ්‍ය සංස්ථාවක් වෙනුවෙන් නිල වාහන හිමිකම නොලැබුණු නිලධාරීන් සිව් දෙනෙකුට එකී විධිවිධානවලට පටහැනිව ඉන්ධන දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.480,900 ක් ද ඉකුත් වර්ෂයේ දී ඉන් නිලධාරීන් තිදෙනෙකුට රු.400,500 ක් ද ගෙවා තිබුණි. කළමණාකරනය විසින් දක්වා තිබුණේ අතීතයේ විධායක නිලධාරීන්ට මෙලෙස ඉන්ධන දීමනා ගෙවූ නිසා එම ක්‍රියාමාර්ගය අනුගමනය කළ බව වුවද,

| | | |
|---|---|---|
| | | විධායක නිලධාරීන් ලෙස වූ ඉහත නිලධාරීන් තිදෙනාගේම උසස්වීම් අනුමත උසස් කිරීමේ පරිපාටි වලින් බැහැර ඒවා විය. |
| | | (ii) නිල වාහන හිමිකම නොලැබූ නිලධාරීන් නිල වාහන ලෙස සංස්ථාවේ වාහන සංචිතයේ පැවති වාහන නිසි අනුමැතියකින් තොරව වෙන් කරගෙන පාවිච්චි කර තිබීම නිසා සංස්ථාවේ දෛනික රාජකාරි කටයුතුවලට බාධාකාරී තත්ත්වයක් මතු වී තිබුණු අතරම, වාහන ධාවන සටහන් හා මාසික ධාවන සටහන් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කරද නොතිබුණි. |
| (ඇ) | 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 03 වගන්තිය | අදාල නියමයන්ට අනුව නිල වාහන සම්බන්ධයෙන් වූ ඇමුණුම් 01 හි ආකෘතිය ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 වගන්තිය හා ආයතන සංග්‍රහයේ vii, 12 නියමය | සමාලෝචිත වර්ෂය තුළදී අදාල විධිවිධානයන්ට පටහැනිව වැඩ බැලීමේ දීමනා වශයෙන් නිලධාරීන් තිදෙනෙකුට රු.213,832 ක් ගෙවීම් කර තිබුණි. |
| (ඊ) | ප්‍රසම්පාදන අත්පොතේ 3.5 හා මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 | වායු සමීකරණ යන්ත්‍රවලට විදුලිය සැපයීම සම්බන්ධව වටිනාකම රු.293,040 ක් වූ වැඩ හා සේවා ලබා ගැනීමට අදාලව ඇති පහත විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.<br>- ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය නොකිරීම<br>- ප්‍රසම්පාදන කමිටුව හඳුනා නොගැනීම<br>- තාක්ෂණික ඇගයීම් මත සිදු නොකිරීම |
| (උ) | අංක 8-1/1-73 හා 2007 නොවැම්බර් 01 දිනැති අමාත්‍යාංශ චක්‍රලේඛය | දෛනික ධාවන සටහන් 268 පොදු ආකෘතියේ පවත්වා ගත යුතු වුවත්, සතොස හඳුන්වා දී තිබුණු, මාසය අවසානයට ඉන්ධන පිරිවැය, ඉන්ධන කාර්යක්ෂමතාවය, ටැංකියේ ගැලුම් ප්‍රමාණය, ආරම්භක හා අවසාන ඉන්ධන ශේෂය, යෙදූ එන්ජින් තෙල් යනාදී ප්‍රමාණවත් තොරතුරු නොතිබුණු ආකෘතියකට අනුව ධාවන සටහන් පවත්වාගෙන ගොස් තිබුණි. |

(ඌ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

-----------------------------

| | |
|---|---|
| (i) මු.රෙ. 103 | අවස්ථා 09 කදී ආයතනයේ වාහන අනතුරුවලට ලක්ව ඉන් අවස්ථා 05 කදී රු.85,085 ක් වූ අළුත්වැඩියා වියදමක් දරා තිබුණු අතර, එම අලාභය රක්ෂණාවරණය මගින් පියවා තිබුණු බව කළමනාකරණය විසින් විගණනය වෙත දන්වා තිබුණි. එහෙත් මු.රෙ.103 ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බැවින් වාහන අලාභය හා එය පියවීම පිළිබඳව සාක්ෂි ලබා ගැනීමේ දුෂ්කරතා මතු වූ අතරම කිසිදු සාක්ෂියක් විගණනය වෙත ඉදිරිපත් කරද නොතිබුණි. |
| (ii) මු.රෙ. 103(1) | වත්කම්වල අලාභයන් සම්බන්ධයෙන් අදාල නියමයන්ට අනුව කටයුතු කර නොතිබුණි. එහිදී රු.5,097,455 ක් වැය කර මිලට ගෙන තිබූ කන්වේයර් යන්ත්‍ර 12 න් යන්ත්‍ර 11 කම විදුලි මෝටර් අස්ථාන ගතවී තිබුණි. තවද, එම අලාභයේ ප්‍රමාණය තීරණය කර ඊට වගකිවයුත්තන්ගෙන් සිදු වූ පාඩුව අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකල නමුත් අදාල නිලධාරීන් ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීම යටතේ ඉවත්වී ඇති බැවින් වගකිවයුතු පුද්ගලයින් හඳුනාගැනීම ප්‍රායෝගිකව කළ නොහැකි බව සභාපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි. |
| (iii) මු.රෙ. 133 | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර විගණනයක් සිදු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iv) මු.රෙ. 137, 138, 228, 245(1) | (i) | විධිවිධානයන්ට පටහැනිව, හා මිල ගණන් කැඳවීමකින් තොරව නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් රු.60,160 ක් ගෙවා ජංගම දුරකථන දෙකක් මිලදී ගෙන තිබුණි. |
| | (ii) | සංස්ථාවේ පරිපාලන හා ව්‍යුහාත්මක වෙනස්කම් ඇතුළත් වැදගත් ලියවිලිවල පිටපත්, විගණකාධිපති වෙත යොමු කළ යුතු බවට වසර ගණනාවක් තිස්සේ විගණනය විසින් කළමනාකාරීත්වය වෙත පෙන්වා දී තිබුණද, එම ඉල්ලීම් නොසලකා, විගණකාධිපති වෙත අදාල පිටපත් යොමු කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (v) මු.රෙ. 225(4) | | වවුචර් පිළියෙල කරන නිලධාරීන් සහ ඒවායේ හරි වැරදි බලන නිලධාරීන් ඒවායේ කෙටිසන් තබා නොතිබුණි. |
| (vi) මු.රෙ. 245(1) හා 257 | | සහතික කරන නිලධාරියා විසින් වවුචර් සහතික කර නොතිබුණි. |
| (vii) මු.රෙ. 261(3) | | ගෙවීම් සඳහා ප්‍රමාණවත් තරම් මුදල් තිබිය යුතු අතර, ඒ සඳහා දිනපතාම මුදල් පොතේ ගණන් හිලව් එකතු කොට ශේෂය දැනගත යුතු වුවත්, එම විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. බැංකු ප්‍රකාශනයේ ශේෂය පදනම් කර ගෙවීම් කටයුතු කරනු ලබන බව කළමනාකරණය විසින් දක්වා තිබුණි. |
| (viii) මු.රෙ. 264 (1) | (i) | විධිවිධාන ප්‍රකාරව රු.196,782 ක් වූ ගෙවීම් සම්බන්ධව අදාල මුදල් ලබා ගත් බවට ලදුපත් ලබාගෙන නොතිබුණි. |
| | (ii) | විධිවිධාන ප්‍රකාරව වැඩ හා සේවා ලබා ගැනීමේදී ඒ වෙනුවෙන් ගෙවූ රු.181,026 ක මුදලක් සඳහා සැපයුම්කරු මුදල් ලබාගත් බවට කුවිතාන්සියක් ගෙවීම් වවුචර් සමඟ අමුණා ඉදිරිපත් කර නොතිබුණු අතර, සහතික නොකළ කුවිතාන්සි ඡායා පිටපත් විගණනයට ඉදිරිපත් කර තිබුණි. |

| | |
|---|---|
| (ix) මු.රෙ. 272(1) | ගෙවීම් වවුචර නිසි පරිදි අනුක්‍රමික අංක පිළිවෙල අනුව ගොනුගත කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (x) මු.රෙ. 272 (3) | සියළුම ගෙවීම් වවුචර අදාල මාසය අවසානයේ සිට සති හයක් ඉකුත් වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, අදාල නියමයන් අනුව කටයුතු කර නොතිබුණි. |
| (xi) මු.රෙ. 454 | පොදු 44 ආකෘතියට අනුව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන නොතිබුණු අතරම, 2011 මාර්තු 11 දින වන විටත් සංස්ථාව හඳුන්වා දුන් විධිමත් ආකෘතියකද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. මේ හේතුව නිසා සංස්ථාවේ වත්කම්වල පැවැත්ම දැඩි අවදානමකට ලක්වී ඇති බව විගණනයේදී බැහැර කළ නොහැක. |
| (xii) මු.රෙ. 754 හා මු.රෙ. 757(1)(අ) | විධිවිධාන ප්‍රකාරව පන්නෙගමුව සහල් සංකීර්ණයේ බඩු වට්ටෝරු පොත් නිසි පරිදි තුලනය කර නොතිබුණි. |
| (xiii) මු.රෙ. 756 | සමීක්ෂණ මණ්ඩලයක් පත්කර පන්නෙගමුව ගබඩා සංකීර්ණයේ වත්කම් පරීක්ෂා කර නොතිබුණි. |
| (xiv) මු.රෙ. 757 (2)(අ) | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (xv) මු.රෙ. 785 (4) | වාහන ලේඛනයක් නඩත්තු කර හෝ එක් එක් වාහන වලට අදාල ලිපිගොනු වෙන් වශයෙන් පවත්වා ගෙන ගොස් හෝ නොතිබුණි. |

### 2.2.9 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.2,741,431,049 ක් වූ වත්කම් ගිණුම් ශේෂ 19 ක්ද, එකතුව රු.1,627,995,005 ක්වූ වගකීම් ගිණුම් ශේෂ 09 ක්ද, එකතුව රු.372,231,466 ක් වූ ආදායම් ගිණුම් ශේෂ 02 ක්ද, එකතුව රු.358,581,020 ක් වූ වියදම් ගිණුම් ශේෂ 22 ක්ද හා එකතුව රු.381,812,395 ක් වූ වෙනත් ගිණුම් ශේෂද ලෙස මුළු එකතුව රු.5,482,050,935 ක් සම්බන්ධයෙන් සාක්ෂි නොමැතිවීම හේතුවෙන් එම විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය / සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි වූ අතර, ඉදිරිපත් කරන ලද පිළිතුරු මගින් ප්‍රමාණවත් තොරතුරු කළමනාකරණය විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ මෙහෙයුම් නොවන ආදායම්ද ඇතුළත් වූ අනෙකුත් ආදායම්වලට පසුව ශුද්ධ ලාභය රු.2,300,113 ක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ එම ශුද්ධ ලාභය රු.46,000,886 ක් විය. එහෙත් සංස්ථාවේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය රු.184,325,627 ක ශුද්ධ පාඩුවක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ශුද්ධ පාඩුව රු.195,717,615 ක් වූයෙන් ශුද්ධ පාඩුව රු.11,391,988 කින් අඩුවීමක් පෙන්නුම් කෙරුණි. මෙම තත්ත්වයට හේතු වී තිබුණේ විකුණුම් 208% කින් වැඩිවීම හා මෙහෙයුම් වියදම් 3.2% කින් අඩුවීම මත වෙළඳ ලාභය වැඩිවීමත් සමාලෝචිත වර්ෂය තුළදී මූල්‍ය පිරිවැය රු.2,840,131 කින් අඩුවීමත් වේ.

(ආ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී ශුද්ධ විකුණුම් රු.125,383,394 කින් එනම්, 208% කින් ඉහළ ගොස් තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව දළ ලාභයේ වර්ධනයක් පෙන්නුම් කළ අතර, එහිදී 2009 වර්ෂයේ 1.9 % ක් වූ දළ අලාභ අනුපාතය සමාලෝචිත වර්ෂයේදී 1.1% දළ ලාභ අනුපාතයක් බවට පරිවර්තනය වී තිබුණි.

(ඇ) කුලී ආදායම් 0.8% ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණු අතර, රු.මිලියන 124.5 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

#### 3.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, වැදගත් අනුපාතයන් කිහිපයක් පහත දැක්වේ.

| | 2010 | 2009 |
|---|---|---|
| * ලාභ අනුපාත | | |
| - දළ ලාභය / (පාඩුව) | 1.1% | (1.9%) |
| - මෙහෙයුම් ලාභය / (පාඩුව) | (100%) | (330%) |
| - ශුද්ධ ලාභය / (පාඩුව) | (207%) | (654%) |
| * ද්‍රවශීලතා අනුපාත | | |
| - ජංගම | 0.48:01 | 0.49:01 |
| - ක්ෂණික වත්කම් | 0.40:01 | 0.48:01 |
| * විකුණුම් වලට මෙහෙයුම් වියදම් අනුපාත | (90%) | (288%) |

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ ස්කන්ධය පිරිහීම 31% කින් අඩුවී තිබුණද, ඊට හේතු වී තිබුණේ ණයහිමියන් රු.542,164,547 කින් කපා හැරීමත්, බැදුම්කර පොළී ආදායම රු.161,906,344 කින් වැඩිවීමත්ය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාවේ ජංගම වත්කම් 27.43% කින් අඩුවීමේ බලපෑම මත කාරක ප්‍රාග්ධනය 21.26% කින් අඩු වී තිබුණි.

ඒ අනුව සංස්ථාවේ ලාභදායිත්වය හා ද්‍රවශීලතාවය මෙහෙයුම් කටයුතු වලට අහිතකර ලෙස බලපා ඇති බවත්, ඒ හේතුවෙන් ආයතනයේ අනාගත පැවැත්ම පිළිබඳව දැඩි අවිනිශ්චිතතාවයක් පෙන්නුම් කෙරෙන බවත් අනුපාත විශ්ලේෂණයේදී නිරීක්ෂණය විය.

3.2 මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.2.1 භෞතික කාර්ය සාධනය
--------------------------

සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම
-------------------------------------------

(අ) 2003 ජූනි 02 දිනැති හා අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අවශ්‍යතාවලට අනුකූල නොවන පරිදි, 2007 සිට 2010 දක්වා වූ වර්ෂ ආවරණය වනයේ පිළියෙල කළ අවිධිමත් සංයුක්ත සැලැස්මක් 2009 දෙසැම්බර් 09 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණු අතරම ක්‍රියාකාර් සැලැස්මද අසම්පූර්ණ ලෙස හා ඉලක්ක නිසි පරිදි නිශ්චය නොකොට පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි.

(ආ) පන්නෙගමුව සහල් සංකීර්ණයේ වී ගබඩා කිරීම ඇතුළුව සහල් නිෂ්පාදනය ඉලක්ක කරගත් සංයුක්ත සැලැස්මක් සංස්ථාව සතුව නොතිබුණි. කි.ග්‍රෑ. 1,000,000 ධාරිතාවෙන් යුත් වී ගබඩාවක් වී අලෙවි මණ්ඩලයට ලබා දී තිබුණද, ඒ වෙනුවෙන් ගාස්තු කිසිවක් අයකර නොතිබුණු අතර, සම්පත් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කර ගැනීමට කළමනාකාරිත්වය අපොහොසත් වී තිබුණි.

(ඇ) කළමනාකරණය සැලසුම් අනුව කටයුතු ක්‍රියාත්මක නොකිරීම නිසා 2009 වර්ෂයේදී වී මිලදී ගැනීම සීමා වී තිබුණු අතර, 2010 වර්ෂයේදී ද වී මිලදී ගැනීම හා සහල් තොග අලෙවිය අඩු වී තිබුණි.

(ඇ) 2010 වර්ෂය වෙනුවෙන් ඉතා දුර්වල හා අවිධිමත් ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර තිබුණු බැවින්, ඒ තුළ දේශීය වශයෙන් කරනු ලබන මිලදී ගැනීම් මොනවාද, විදේශ වෙළඳපොලෙන් කරනු ලබන මිලට ගැනීම් මොනවාද යන්න හඳුනාගෙන නොතිබුණි. ඒ තුළ ආයතනයේ ඇසුරුම් ඒකකය, ප්‍රවාහන අංශය හා සහල් සැකසුම් මධ්‍යස්ථානවල අපේක්ෂිත ඉලක්ක කිසිවක් හඳුනාගෙන නොතිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව, 2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේ විකුණුම් ආදායමේ 208% ක වර්ධනයක් පෙන්නුම් කළද, 2010 වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කර තිබුණු ක්‍රියාකාර සැලැස්මේ අපේක්ෂිත විකුණුම් ආදායම 2008 හා 2009 වර්ෂවලට සාපේක්ෂව පිළිවෙලින් 86.5% කින් සහ 31% කින් අඩුවීමක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, සංස්ථාව ක්‍රියාකාර සැලැස්මෙන් බොහෝ දුරස්ථව කටයුතු කර තිබුණි.

(ඊ) ක්‍රියාකාර සැලැස්ම අනුව, 2010 වර්ෂයේ පළමු කාර්තු තුන තුළදී වෙළඳ ද්‍රව්‍ය දෙකක් මිලට ගෙන විකිණීම තුළින් රු.168,784,500 ක ආදායමක් අපේක්ෂා කර තිබූ අතර, ඒ තුළින් රු.20,830,500 ක දළ ලාභයක් අපේක්ෂා කළද, 2010 වර්ෂයේ දෙසැම්බර් තෙක් එම ඉලක්ක කිසිවක් සපුරා ගෙන නොතිබුණි.

(උ) ආයතනයේ සියළු මිලදී ගැනීම් 2010 වර්ෂයේ අවසාන කාර්තුවේදී දේශීය සැපයුම්කරුවන්ගෙන් ලබාගෙන තිබුණු අතර, ක්‍රියාකාර සැලැස්මට පරිබාහිරව රු.262,219,083 ක් වටිනා ද්‍රව්‍ය වර්ග 10 ක් මිලදී ගැනීම සිදු කර තිබුණි.

මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ක්‍රියාකාර සැලැස්මක් ඉදිරිපත් කළ නොහැකි බවත් එම නිසා ඒ හා සම්බන්ධව මෙහෙයුම් කටයුතුද සැලසුම් කළ නොහැකි බවත් කළමණාකාරීත්වය විසින් දක්වා තිබුණි.

3.2.2 ගෙවීමට ඇති ලංසු සුරැකුම් ණය ( මහජන බැංකුව )

---

2004 හා 2005 වර්ෂ වලදී සහල් සහ තිරිඟු පිටි ආනයනය කිරීම සඳහා භාණ්ඩාගාරයේ සුරැකුම් මත මහජන බැංකුව විසින් සංස්ථාව වෙත ලංසු සුරැකුම් ණය පහසුකම් ලබා දී තිබුණු අතර, 2010 දෙසැම්බර් 31 දින වනවිට මෙම ණය වලින් රු.207,050,943 ක් පරිශේෂව පැවතුණි. ප්‍රමාණවත් ලාභයක් නොතිබීම හේතුවෙන් අරමුදල් සතොස තුළ නොවූයෙන් මෙම තත්ත්වය උද්ගත වූ බවත් මේ පිළිබඳව භාණ්ඩාගාරය දැනුවත් කර ඇති බවත් කළමනාකාරීත්වය විසින් 2009 මාර්තු 19 දිනැති පිළිතුරු ලිපියෙන් මා වෙත දන්වා තිබුණද 2011 මැයි මස අවසන් වන විටත් එම වටිනාකම නොවෙනස්ව පැවතුණි.

### 3.2.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) අංක 510 ගබඩා සංකීර්ණයේ පවත්නා සතොස සතු වෙළඳ තොග, අනෙකුත් වත්කම් සහ ගබඩාවේ කාර්යය මණ්ඩලය භෞතිකව වෙන්කොට හඳුනා නොගෙන ලංකා සතොස වෙත ලබා දීමට කටයුතු කර තිබූ නිසා 510 ගබඩාව තුළ වූ සතොස ට අයත් තොග, වත්කම් සහ කාර්ය මණ්ඩලය නිශ්චිතව හඳුනා ගැනීමේ දුෂ්කරතා මතු වී තිබුණි.

(ආ) සහල් අලෙවි කිරීමේදී එම සහල්වල මිල ගණන් හා විකුණුම් ප්‍රමාණයන් තීරණය කිරීම ලංකා සතොස ආයතනයේ අභිමතය පරිදි සිදු වී තිබුණි.

(ඇ) ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ ක්‍රමය යටතේ 2004 වර්ෂයේදී ඉවත්වූ සේවකයින් පාරිතෝෂිත දීමනා සහ අනෙකුත් දීමනා ගෙවීම් කිරීමට පෙර, ඔවුන්ගෙන් ආයතනයට අයවිය යුතු මුදල් හා භාර දිය යුතු වත්කම් තැන්පත් හා ලේඛන ආදිය නිසි පරිදි ආයතනයට බාර දීමට කටයුතු කර තිබේද යන්න වර්තමාන කළමනාකාරිත්වය ප්‍රමාණවත් තහවුරු කර ගැනීමක් කර නොතිබුණි.

(ඈ) සංස්ථාවේ පාලන අධිකාරිය විසින් වයස අවුරුදු 55 ට එළඹෙන සේවකයින් විශ්‍රාම ගැන්වීම සඳහා පාලන අංශයේ 27/2002 හා 2002 ජූනි 21 දරන චක්‍රලේඛය නිකුත් කර තිබුණි. මෙම පදනම මත විශ්‍රාම ගැන්වීමට එරෙහිව හා වෙනත් හේතූන් මත ආයතනයට එරෙහිව පවරනු ලැබූ නඩු 40 ක් 2009 වර්ෂය අවසන් වන විටද තීරණයකට එළඹ නොතිබුණු අතර, එම නඩුවල තත්ත්වය පිළිබඳ කිසිදු තොරතුරක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) ඉකුත් වර්ෂ තුන තුළ තීරණයකට එළඹීම මත වන්දි ගෙවීමට සිදු වූ නඩු 170 ක් වෙනුවෙන් ආයතනය රු.34,109,357 ක වන්දි මුදලක් ගෙවා තිබුණු අතර, 2010 වර්ෂය තුළදී ආයතනයට එරෙහිව පවරා ඇති නඩු සංඛ්‍යාව හෝ තීරණයකට එළඹුණු නඩු පිළිබඳ කිසිදු තොරතුරක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ඊ) 1985 ජනවාරි 01 දින ගාලු පාරේ අංක 401 හා 407 දරන පරිශ්‍රයේ බිම් මහල හා දෙවැනි මහල වෙනුවෙන් ගිවිසගත් බදු ඔප්පුව පරිදි කුලී නොගෙවීම මත සංස්ථාවට එරෙහිව පවරන ලද නඩුවට අදාලව 2006 වර්ෂයේදී රු.6,034,000 ක වන්දියක් ගෙවීමට නියම කර තිබුණු අතර එම මුදල් නොගෙවීම නිසා සංස්ථාව සතු රු.12,275,000 ක් වූ වාහන 35 ක් තහනම් කර තිබුණි. මේ සම්බන්ධව රු.මි. 15 ක් ගෙවීමට උසාවි තීරණයක් දුන් නමුත් රු.මි. 09 ක් ගෙවා සමතයකට එළඹීමකට පාර්ශවකරුවන් සමඟ එකඟ වූ බව දක්වා තිබුණි. නමුත් 2012 ජූලි 05 දින වනවිටත් කිසිදු තොරතුරක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ද) බජට් ෂොප් පවත්වාගෙන යාමට ගොඩනැගිලි කුලියට දීමේදී අදාල පාර්ශව සමඟ විධිමත් පරිදි ගිවිසුම් වලට එළඹී නොතිබුණු අතර, රජයේ තක්සේරුකරුගේ තක්සේරුවක් ලබාගෙන කුලිය තීරණය කර නොතිබුණි. අමාත්‍යාංශ තීරණයට අනුව කටයුතු කිරීමට සිදුවූ බැවින් විධිමත් පරිදි කටයුතු කිරීමට කාලයක් නොවූ බව විගණනයට දන්වා තිබුණු නමුත් අදාල අමාත්‍යාංශ තීරණය විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඳ) වෙළඳ, වාණිජ, පාරිභෝගික කටයුතු හා අලෙවි සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් මත සංස්ථාව විසින් රු.14,501,998 ක් වූ සහල් සැකසීම් යන්ත්‍ර 140 ක් 2006 සැප්තැම්බර් මාසයේදී ආනයනය කර තිබුණි. මහජන බැංකුවෙන් ලබා දෙන ණය මත පොළොන්නරුව, අම්පාර, අනුරාධපුරය ආදී සහල් නිෂ්පාදනය කරන ප්‍රදේශ වල ගොවීන් 25 දෙනෙකුට මෙම සහල් සැකසීම් යන්ත්‍ර වලින් යන්ත්‍ර 25 ක් බෙදා දී තිබුණද, මහජන බැංකුව ඉදිරිපත් කළ ණය කොන්දේසිවලට එකඟ නොවීම නිසා මෙම යන්ත්‍ර 25 ආපසු ලබා ගෙන තිබුණි. ඒ අනුව සමූපකාර අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහනකට මෙම යන්ත්‍ර භාරදී මුදල් ලබා ගන්නා බව දන්වා තිබුණද, ඉන් එක් යන්ත්‍රයක් පමණක් විකුණන ලදුව 2010 වර්ෂය අවසන් වන විටද ඉතිරි සහල් සැකසීමේ යන්ත්‍ර 139 පිළිබඳව ඵලදායී ක්‍රියාමාර්ගයක් නොගෙන ස.තො.ස. 510 ගබඩාව තුළ විගණිත දිනය වනවිටත් ගබඩා කර තිබුණි.

### 3.2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සංස්ථාව සතු ගොඩනැගිලි 12 ක් එහි උප සමාගමක් වන සී/ස ලංකා සතොස සමාගමට කුලියට දී තිබුණු අතර, ගොඩනැගිලි කුලිය සම්බන්ධයෙන් රජයේ තක්සේරුකරුගේ තක්සේරුවක් ලබාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් නිවැරදි තක්සේරුවක් ලබා ගෙන කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී අදාල නිලධාරීන්ට උපදෙස් ලබා දී තිබුණද, 2012 ජූලි 05 දින තෙක් අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 අප්‍රේල් 01 දින සිට 2010 දෙසැම්බර් 31 දින දක්වා සී/ස ලංකා සතොස සමාගමෙන් ලැබිය යුතු ගොඩනැගිලි කුලිය රු.41,839,201 කි. ඒ අනුව ගොඩනැගිලි කුලියට දුන් 2006 අප්‍රේල් 01 දින සිට 2012 ජූලි 05 දින තෙක් කිසිම මුදලක් අයකර ගත නොහැකි තත්ත්වයක් පැවතියදීත් සතොස ආයතනය විසින් දැනට පාවිච්චි කරමින් පවතින ඉතිරි ගබඩාද කිසිදු මුදලක් තීරණය කිරීම හෝ අයකිරීමකින් තොරව ලංකා සතොස ආයතනයේ ගබඩා කිරීම වෙනුවෙන් ලබා දීමට කළමනාකරණය කටයුතු කර තිබුණි.

(ඇ) සී/ස ලංකා සතොස සමාගමේ ප්‍රධාන කාර්යාලය ස්ථාපිත කර ඇති සංස්ථාවට අයත් ගොඩනැගිල්ලෙන් වර්ග අඩි 6000 ක් පමණ බිම් ප්‍රමාණයක් අදාල සමාගම පාවිච්චි කරන නමුත් කුලිය ගණනය කර තිබුණේ වර්ග අඩි 2350 කට පමණි. අතිරේක ඉඩකඩ සඳහා වූ කුලිය අයකර ගැනීමට 2010 වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණු අතර, අයකර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත් බවට 2011 දෙසැම්බර් 08 දිනැති ලිපියෙන් මා වෙත දන්වා තිබුණද, අදාල මුදල් අයකරගත් බවට තහවුරු කිරීම් කිසිවක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3.2.5 ඌන උපයෝජිත වත්කම්

(අ) වටිනාකම රු.25,521,569 ක් වූ යන්ත්‍රාගාරයක්ද, වී කි.ග්‍රෑ 1,000,000 ක් ගබඩා කළ හැකි ගබඩා සංකීර්ණයක්ද සහල් කි.ග්‍රෑ 350,000 ක ධාරිතාවෙන් යුතු සහල් ගබඩාවකින්ද සමන්විත වූ පන්නෙගමුව සහල් සංකීර්ණය නිෂ්ක්‍රියව හා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම යටතේ සිල්ලර වෙළඳාම සතොස රිටේල් ලිමිටඩ් වෙත පැවරීම සහ තොග වෙළඳාම අඩුවීම නිසා සංස්ථාවේ සේවකයින් ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගන්වා තිබුණි. එලෙස ව්‍යාපාරික කටයුතු සීමා වීම හේතුවෙන් පිරිවැය රු.682,063,488 ක් වූ ස්ථාවර වත්කම් 2004 වර්ෂයේ සිට නිෂ්කාර්ය හා ඌන උපයෝජිතව පැවතුණි. අක්‍රිය වත්කම් අපහරණය කිරීම පිණිස සුදුසු ක්‍රියා මාර්ග ගනු ලබන බවට කළමනාකාරිත්වය විසින් 2009 මාර්තු 19 දිනැති පිළිතුරු ලිපියෙන් මා වෙත දන්වා තිබුණද, අදාල නිවැරදි කිරීම් සිදු කළ බවට තහවුරු කර ගැනීමේ මූලික පහසුකම් කළමනාකාරිත්වය විසින් විගණනය වෙත සපයා නොතිබුණු අතර, ලිඛිත තහවුරු සාක්ෂිද ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) සංස්ථාවේ ප්‍රතිව්‍යුහගතකරණය යටතේ ආරම්භ කළ සමාගම් 11 ක් අතුරින් සතොස රිටේල් ලිමිටඩ් සමාගම පාඩුවීම හේතුවෙන් 2005 ජූනි සිට ව්‍යාපාරික කටයුතු නතර කර තිබුණු අතර, 2006 ඔක්තෝබර් 23 දින කොළඹ දිසා අධිකරණයේ නඩු තීන්දුවක් අනුව එම සමාගම විසුරුවා හැරීමට නියෝග කර තිබුණි. තවද, අනෙකුත් සමාගම් 10 ද නාමිකව පැවතීම හේතුවෙන් එම සමාගම් වලින් ලැබිය යුතු මුදල් ලෙස 2009 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු රු.523,821,349 ක් වූ ජංගම වත්කම් 2010 වර්ෂයේදී ගිණුම්වලින් කපා හැර තිබූ අතර, එම වත්කම් කපා හැරීමට අදාලව ලබාගත් අනුමැතිය ගිණුම් තැබීමට අදාල ජ'නල් සටහන් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

(ඇ) 2010 වර්ෂය ආරම්භයේ පැවති වාහන 104 කින් රු.12,685,000 ක් වටිනාවාහන 58 ක් නිෂ්ක්‍රිය තත්ත්වයේ පැවති අතර, ඉන් රු.125,000 ක් වටිනා වාහන 03 ක් ආයතනයේ පවතින බවට හෝ විකිණීමක්, ඉවත් කිරීමක් හෝ කළ බවට කිසිදු තහවුරු කිරීමක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) සංස්ථාව විසින් 2007 දෙසැම්බර් 31 දින වන විට රු.32,074,662 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනයකින් තොරව සී/ස ලංකා සතොස සමාගමට ලබා දී තිබුණු අතර, ඒ වෙනුවට මුදල් ලබා ගැනීමට හෝ සමාගමේ කොටස් ලබා ගැනීමට හෝ එකඟතාවයකට පැමිණ නොතිබුණි. තවද, 2008, 2009 වර්ෂ වලදී පවරා දෙනු ලැබූ වත්කම් පිළිබඳව ලේඛන පවත්වා ගැනීම හෝ ඒ පිළිබඳ තොරතුරු 2012 ජූලි 05 දින තෙක් විගණනය වෙත ඉදිරිපත් කර හෝ නොතිබුණු අතර, අසම්පූර්ණ ලේඛණයක් 2011 දෙසැම්බර් මාසයේදී විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

(ඊ) 2010 වර්ෂයේද ආයතනය සතු ස්ථාවර පොදු කාර්ය පිරිවැය රු.85,110,614 ක් වූ වී මෝල් 02 ක් නිශ්ක්‍රීයව ඌන උපයෝජිත තත්ත්වයේ පැවතීම නිසා අදාල අංශ වල ශ්‍රමයද නිශ්ක්‍රිය හා ඌන උපයෝජිත තත්ත්වයේ පැවතුණි. මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් වී අලෙවි මණ්ඩලයේ ණය පදනම මත වී මිලදී ගන්නා බැවින් මෙම තත්ත්වය උද්ගත වී ඇති බැව් කළමනාකාරත්වය විසින් විගණනය වෙත දන්වා තිබුණි.

### 3.2.6 ප්‍රතිව්‍යුහගත කිරීමේ ගනුදෙනු

--------------------------------

සංස්ථාව ප්‍රතිව්‍යුහගත කිරීම 2003 වර්ෂයේදී ආරම්භ කර තිබුණු අතර, ඒ අනුව 2003 දෙසැම්බර් 01 දිනට වාණිජ බැංකු 06 කට ගෙවිය යුතුව තිබුණු රු.මිලියන 5,493 ක ණය මුදල රු.මිලියන 4,397 ක් වශයෙන් සංශෝධනය කිරීම සඳහා අදාල වාණිජ බැංකු එකඟ වී එම මුදල වසර 13 කින් ගෙවනු ලබන පරිදි භාණ්ඩාගාර බැඳුම්කර අදාල වානිජ බැංකු වෙත නිකුත් කර තිබුණි.

සංස්ථාව සතු ස්ථාවර වත්කම් වලින් රු.බිලියන 1.8 ක වත්කම් රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම මගින් විකුණා ලැබෙන මුදලින් 2005 වර්ෂයේදී එකී භාණ්ඩාගාර බැඳුම්කර නිරවුල් කිරීමටත් එකඟ වී තිබුණි. තවද එම ණය වෙනුවෙන් අදාල අර්ධ වාර්ෂිකව පොලී ගෙවීමටත් එසේ ගෙවිය යුතු පොලියෙන් 50% ක් භාණ්ඩාගාරය විසින් දැරීමටත්, ඉතිරි 50% ස.තො.ස. සතු දේපල ස.තො.ස. රීටේල් සමාගමට කුලියට දීමෙන් ලැබෙන කුලි ආදායමින් ගෙවීමටත් එකඟ වී තිබුණි. ඒ අනුව භාණ්ඩාගාර බැඳුම්කර වෙනුවෙන් වර්ෂ 13 කට ගෙවිය යුතු පොලිය ලෙස රු.4,209,564,684 ක් හා ඒ සම්බන්ධව භාණ්ඩාගාර බැඳුම්කර 8.5% කට වට්ටම් කරන ලද ශුද්ධ වර්තමාන අගය මත ගණනය කර රු.1,522,544,041 ක් ගිණුම් ගත කර තිබුණි.

නමුත් ප්‍රතිව්‍යුහගතකරණය යටතේ භාණ්ඩාගාර බැඳුම්කර වෙනුවෙන් වූ වගකීම් නිරවුල් කිරීම සඳහා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිසම වෙත වත්කම් පැවරීමක් සිදුකර නොතිබුණි. 2004 පෙබරවාරි 03 දිනැති අංක 04/0103/136/007/ඒපීසී/710 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් සංස්ථාව විසුරුවා හැරීමට තීරණය කර තිබුණද, 2004 අගෝස්තු 11 දිනැති අංක 04/0892/012/011 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සංස්ථාව විසුරුවා හැරීම නතර කිරීමට තීරණය කර තිබුණි.

තවද, සංස්ථාව ප්‍රතිව්‍යුහගතකරණයේදී එකඟ වී තිබුණු පරිදි 2004 මැයි 14 දින සිට අර්ධ වාර්ෂිකව වාණිජ බැංකු වෙත ගෙවිය යුතු පොලී මුදලෙන් 50% ක් ගෙවීම ස.තො.ස. රිටේල් සමාගමෙන් කුලී ආදායම නොලැබීම හේතුවෙන් අතපසු කර තිබුණු අතර, අදාල වාණිජ බැංකු දෙකක් විසින් ණය පොලී අයකර ගැනීම සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවියේ නඩු පවරා තිබුණි. එම නඩු තීන්දුව ප්‍රකාරව 2006 මැයි 14 දක්වා ගෙවිය යුතු පොලී වශයෙන් රු.128,625,588 ක් එම බැංකු දෙකට ගෙවා තිබුණු අතර, එම මුදල මූල්‍ය ප්‍රකාශන වල දිගු කාලීන වගකීම් වලින් අඩු කර දක්වා තිබුණි.

සංස්ථාව ප්‍රතිව්‍යුහගතකරණය කිරීම යටතේ භාණ්ඩාගාරය නිකුත් කරන ලද බැඳුම්කර වෙනුවෙන් ගෙවිය යුතු මුදල් සංස්ථාව සතු දේපල රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මගින් අලවි කර ලැබෙන ආදායමෙන් මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවිය යුතු වුවත් එසේ මුදල් ප්‍රතිපූර්ණයක් සිදු නොවීමත්, සංස්ථාව වසා දැමීමේ තීරණය අහෝසි කර නව අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව සංස්ථාව තවදුරටත් පවත්වාගෙන යාමත් නිසා මහා භාණ්ඩාගාරය වෙත ගෙවිය යුතු රු.මිලියන 4,397 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම හා ඊ සඳහා වර්ෂ 13 කට අදාල ගෙවිය යුතු පොලියත් එම ණය වෙනුවෙන් 8.5% කට වට්ටම් කළ වර්තමාන අගය වශයෙන් රු.4,922,577,055 ක් 2009 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අතර, භාණ්ඩාගාරය විසින් ඊ සඳහා 2009 වර්ෂයට අදාලව රු.1,133,344,338 ක දායකයන් සැපයීම හේතුවෙන් එම අගය, හඳුනා නොගත් රු.50 ක් වූ වෙනසක් සහ 2010 වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.161,906,334 ක් වූ දායකය යටතේ 2010 දෙසැම්බර් 31 දිනට රු.3,627,326,333 බවට පරිවර්තනය වී තිබුණි. තවද, භාණ්ඩාගාර දායකය වෙනස් වීම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරද නොතිබුණි.

### 3.2.7 ආයෝජන

සංස්ථාව විසින් සමාගම් 2 ක පිළිවෙලින් රු.171,928,690 ක් සහ රු.9,923,710 ක් වශයෙන් එකතුව රු.181,852,400 ක මුදලක් 1999 වර්ෂයේදී ආයෝජනය කර තිබුණි. එක් සමාගමක් පාඩු සිදු වීම හේතුවෙන් 2005 ජූනි මාසයේ සිට අකර්මන්‍ය තත්වයට පත් වී තිබුණු බැවින් 2006 ඔක්තෝබර් 23 දින කොළඹ දිසා අධිකරණය ප්‍රකාශ කළ නඩු තීන්දුවක් ප්‍රකාරව විසුරුවා හැරීමට නියෝග කර තිබුණි. එහි ආයෝජනය කර තිබුණු මුදල් ආපසු ලබා ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පවතින අතර, අනෙක් සමාගමෙන්ද අදාල ආයෝජනය සඳහා 1999 සිට 2010 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි. මෙම ආයෝජන කපා හැරීමට සුදුසු ක්‍රියා මාර්ග ඉදිරියේදී ගනු ලබන බව කළමනාකාරීත්වය විසින් 2009 ජූලි 24 දිනැති පිළිතුරු ලිපියෙන් මා වෙත දන්වා තිබුණද, 2010 වර්ෂය අවසානය දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 3.2.8 වාහන උපයෝජනය

(අ) සංස්ථාවේ ප්‍රවාහන අංශය තුල පැවති වාහන 104 ක් අතුරින් රු. 11,673,000 ක් වූ වාහන 45 ක් 2006 වර්ෂයේ සිට අනාරක්ෂිතව හා නිෂ්ක්‍රියව පැවති අතර, රු. 1,012,000 ක් වූ වාහන 13 ක් 2006 වර්ෂයේ සිට නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) ඉකුත් වර්ෂ වලදීද දෛනික ධාවන සටහන් හා ලොග් පොත්වල සටහන් යෙදීම ඉතා අවිධිමත් හා නිසි අධීක්ෂණයකින් යුතුව නියමිත දිනයන්හිදී සිදු කර නොතිබියදී සමාලෝචිත වර්ෂයේදී ස.තො.ස. විසින් ගමන් වියදම්, සංයුක්ත දීමනාද ඇතුළුව වාහන ධාවන වියදම් ලෙස රු.3,970,099 ක් වූ වියදමක් දරා තිබුණි.

### 3.2.9 සේවක පාර්තෝෂික වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

1983 අංක 12 දරන පාර්තෝෂික ගෙවීම් පනත අනුව විශ්‍රාම යන හෝ සේවයෙන් ඉවත් වන සේවකයින් සඳහා 2010 අවසන් වන විට රු.26,193,506 ක් වෙන් කර තිබුණද, පාර්තෝෂික ගෙවීම් වෙනුවෙන් වූ අනාගත බැදියාවන්ට මුහුණ දීම සඳහා අරමුදලක් ගොඩනහා නොතිබුණි.

### 3.2.10 නිෂ්ක්‍රීය වියදම්

පන්නෙගමුව සහල් සංකීර්ණයේ රු.4,190,916 ක් වූ වී කෙටීමේ වියදම් වලින් රු.3,200,000 ක්ම නිෂ්ක්‍රීය කාලයක් සඳහා දරන ලද, නිෂ්ක්‍රීය වියදමක් බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම තත්ත්වය වී අලෙවි මණ්ඩලයෙන් සපයනු ලබන වී ප්‍රමාණය මත සිදුවන වී මෝල් ක්‍රියාකාරීත්වය මත පදනම් වන්නක් බව සභාපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

### 3.2.11 අවිධිමත් ගනුදෙනු

විගණනය වෙත ලැබී තිබුණු තොරතුරු අනුව බේකරි නිෂ්පාදන අලෙවියෙන් රු.1,695,652 ක් වූ දළ ලාභයක් නිරූපණය වුවද, විකුණුම් මුදල් බැංකුගත කළ බවට විගණනය වෙත තහවුරු නොවූ සීමාව පහත සඳහන් පරිදි රු.236,880 සිට රු.1,321,285 ක් දක්වා විහිදී ගොස් තිබුණි.

| අයකැමිගේ දෛනික පත්‍රිකා අනුව බැංකුගත කළ විකුණුම් වටිනාකම | ගිණුම් අංශ තොරතුරු අනුව බැංකුගත කළ වටිනාකම | බැංකු තැන්පතු කුවිතාන්සි අනුව බැංකුගත කළ වටිනාකම | බැංකුගත කර නොමැති බවට නිරීක්ෂණය වූ වටිනාකම |
|---|---|---|---|
| රු. | රු. | රු. | රු. |
| 11,956,043 | 13,040,448 | - | 1,082,405 |
| 11,956,043 | - | 11,719,163 | 236,880 |
| - | 13,040,448 | 11,719,163 | 1,321,285 |

ඒ අනුව, බේකරි නිෂ්පාදන මිලදී ගැනීම සහ විකුණුම් කටයුතු නිසි අධීක්ෂණයකින් තොරව සිදු වී තිබුණි. 2011 අප්‍රේල් 04 දිනැති අංක CWE/GA/10/R-17 මගින් ඉදිරිපත් කරන ලද පිළිතුර අනුව එම මුදල් අඩුව රු. 496,706 ක් පමණක් බවත් ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බවත් විගණනය වෙත දන්වා තිබුණද, විගණනය විසින් පෙන්වා දී ඇති මුදල් අඩුව පිළිබඳව නිසි පැහැදිලි කිරීමක් කිරීමට කළමනාකාරීත්වය 2012 ජූලි 05 දින තෙක් අපොහොසත් වී තිබුණි.

3.2.12 ඉලක්ක වෙළඳපොළ හඳුනා නොගත් ගනුදෙනු

පන්නෙගමුව සහල් සංකීර්ණයේ නිෂ්පාදිත සහල් තොග ස.තො.ස. ප්‍රධාන ගනුදෙනුකරු වන ලංකා සතොස ආයතනයට අලෙවි කළ හැකිද යන්න හඳුනා ගැනීමක් හෝ ඇස්තමේන්තු කිරීමක් පවා සිදු කර නොතිබුණු අතරම, මිලදී ගනු ලබන ප්‍රමාණයන් හා මිලදී ගැනීමට අපේක්ෂිත මිල ගණන් පිළිබඳව හෝ එකඟතාවයක් එම ආයතනය සමඟ ඇති කරගෙන නොතිබුණි. වෙළඳපොලේ ඉහළ මිල ගණන් යටතේ ඉල්ලුමක් පැවතියදීත් ලංකා සතොස විසින් මිලදී ගෙන තිබුණේ කි.ග්‍රෑ. 188,650 ක් පමණි. ඒ අනුව නිෂ්පාදිත සහල් තොගය කි.ග්‍රෑ. 528,550 න් කි.ග්‍රෑ. 339,900 ක්ම 2010 දෙසැම්බර් 17 විගණන පරීක්ෂාව සිදු කළ දිනය තෙක්ම ගබඩාවේ ඉතිරිව පැවති අතර, අලෙවි කළ සහල් වෙනුවෙන්ද කිසිදු මුදලක් 2012 ජූලි 05 දින තෙක් අයකර ගෙන නොතිබුණු බැව් විගණනය විසින් පෙන්වා දී තිබුණි. වාරික ක්‍රමයට මුදල් අයකර ගනිමින් පවතින බව කළමනාකාරීත්වය විසින් දන්වා තිබුණි. තවද ගබඩාවේ ඉතිරිව පැවති කි.ග්‍රෑ. 339,900 ක් වූ සහල් තොගය සම්බන්ධව ගනු ලැබූ ක්‍රියාමාර්ග මොනවාද යන්න 2012 ජූලි 05 දින තෙක් විගණනය වෙත පැහැදිලි කර නොතිබුණි.

3.2.13 හඳුනාගත් අලාභ හා පාඩු

(අ) ලංකා සතොස වෙනුවෙන් සහල් අලෙවි කිරීමේ නිසි ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම මත සහල් තොග සතොසට අයත් ගබඩාතුළ මාස ගණනාවක් පැවතීමත් ඒවායේ වර්ණය වෙනස් වීමත් නිසා කිලෝවක් රු.54 කට විකිණීමට හැකියාව පැවති සහල් කි.ග්‍රෑ 7550 ක් කිලෝවක් රු.35 වැනි අඩු මිලකට විකිණීමෙන් රු.145,655 ක් වූ මූල්‍ය අලාභයක් සිදු වී තිබුණු අතර, විකුණූ සහල් වෙනුවෙන් මුදල් අයකර ගැනීමක්ද කර නොතිබුණි.

(ආ) නිවුඩු සහල් කිලෝවක් රු.19 බැගින් ප්‍රවාහන වියදමක් නොමැතිව ප්‍රාදේශීය ගැනුම්කරුවෙකුට විකිණීමට හැකියාව තිබියදී, එම සහල් තොග පන්නෙගමුව සිට කොළඹ පිහිටි 510 ගබඩාවට ගෙනගොස් අනතුරුව රු.13 ක් වැනි අඩු මුදලකට කි.ග්‍රෑ. 10860 ක් අදාල ගැනුම්කරු වෙත සතොස විසින්ම කිලෝ මීටර් 235 ක් ප්‍රවාහනය කර දී තිබුණි. 2012 ජූලි 05 දින තෙක් අදාල මුදල වූ රු.141,180 ක් ලැබී නොතිබුණි. ඒ අනුව, සංස්ථාවට රු.65,140 ක ශුද්ධ අලාභයක් සිදු වී තිබුණු අතර, ගැනුම්කරු වෙත ප්‍රවාහනය කර දීමේ ගාස්තු ඇස්තමේන්තු කර හෝ නිශ්චය කර අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ඇ) කි.ග්‍රෑ. එකක් රු.24.50 බැගින් කි.ග්‍රෑ. 16500 ක් මිලදී ගැනීමට ප්‍රාදේශිය ගැනුම්කරුවෙකු මිල ගණන් ඉදිරිපත් කර තිබියදී එම නිවුඩු (සහල් කුඩු) අලෙවි කිරීමට කළමනාකාරිත්වය කටයුතු කර නොතිබුණු අතර, එසේ අලෙවි නොකිරීමට හේතුද විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) සංස්ථාව විසින් සෙට්ටිකුලම සහන ගම්මානවලට බේකරි නිෂ්පාදන අලෙවි කිරීමට ස.තො.ස. අලෙවිසැල්වලට එවීම සඳහා බේකරි හිමියෙකුට නිකුත් කර තිබුණු පිරිවැය රු.77,490 ක් වූ බහලුම් 246 ක් 2012 ජූලි 05 දින තෙක් ආපසු ස.තො.ස. වෙත භාර දී නොතිබුණු අතර, වගකිවයුත්තන් හඳුනාගෙන අදාල පාඩුව පියවා ගැනීමටද කටයුතු කර නොතිබුණි.

### 3.2.14 සැපයුම් හා සේවා

සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදී එකලා හා තෙකලා විදුලිය ලබා ගැනීම සඳහා අවිධිමත් ක්‍රියා පරිපාටියක් අනුගමනය කරමින් රු.293,040 ක් ගෙවා තිබුණි.

### 3.2.15 සම්බන්ධිත රාජ්‍ය සමාගම් ගනුදෙනු

2010 දෙසැම්බර් 27 දින කරනු ලැබූ භෞතික පරීක්ෂාවේදී 510 ගබඩාව තුළ සීමා සහිත රාජ්‍ය වානිජ (සමූපකාර තොග වෙළඳ) සමාගමට අයත් කොත්තමල්ලි මෙ.ටො. 197 ක්ද කඩල මෙ.ටො. 42 ක්ද දක්නට ලැබුණි.

තවද, සංස්ථාව විසින් සීමාසහිත රාජ්‍ය වාණිජ (සමූපකාර තොග වෙළඳ) සමාගමේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් රු.12,454,923 ක් වූ තොග නිදහස් කිරීමේ වියදමක්ද දරා තිබීමත්, එම සමාගමට අයත් උක්ත තොග ස.තො.ස. ගබඩා තුළ ගබඩා කරගෙන තිබීමත්, කුමන පදනමක් හෝ අනුමැතියක් යටතේ සිදු කළේද යන්නත් නිශ්චිත නොවූ අතර, සංස්ථාව විසින්ම සමස්ථ වෙළඳ ගනුදෙනුව ක්‍රියාත්මක කිරීම තුළින් ඵලදායිතාවයක් ජනිත කළ හැකිව තිබියදී එසේ නොකොට අතරමැදි සේවා සපයන්නෙකු ලෙස ඵලදායී නොවන ව්‍යාපාරික කටයුත්තක නිරත වී තිබුණි.

### 3.2.16 ජාතික ආර්ථිකයට සංස්ථාවේ දායකත්වය

ජාතික ආර්ථිකයට සංස්ථාව විසින් ඉටු කළ යුතු දායකත්වය ලබා දීම අපහසු වීමට හේතුව ලෙස, "සංස්ථාවේ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් යම් යම් කටයුතු කරගෙන යාමේ ප්‍රායෝගික දුෂ්කරතා මතු වී ඇති බව" කළමනාකාරිත්වය විසින් විටින් විට විගණනය වෙත දන්වා තිබුණද, පෙරදී ස.තො.ස. ඉටු කළ කටයුතු වෙනුවෙන් දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය සමාගම් අභිබවා සතො.ස. ආයතනයට කටයුතු කිරීමේ හැකියාවක් පවතින බවට පහත කරුණු අනුව තහවුරු වී තිබුණි.

(ඉ) රාජ්‍ය සමාගම්වල මූල්‍ය දුෂ්කරතා වෙනුවෙන් කටයුතු කරන සංස්ථාව බවට පත් වී තිබීම.
උදාහරණ : සීමාසහිත රාජ්‍ය වාණිජ (සමුපකාර තොග වෙළඳ) සමාගම වෙනුවෙන් ආනයන තොග නිදහස් කිරීමේ වියදම් දැරීම.

(ආ) සීමාසහිත ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සඳහා රු.මි. 25 ක ණය මුදලක් සැපයීමට වූ අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ ඉල්ලීමට යටත්ව රු. මි. 10 ක් සමාලෝචිත වර්ෂයේදී ලබා දීම.

(ඇ) ලංකා ස.තො.ස. සමාගමට සේවා සැපයීම ඉලක්ක කර ගනිමින් ඇති කළ ඇසුරුම් අංශයේ, නිෂ්ක්‍රියව පවතින හා ඌන උපයෝජිත උපකරණ / වත්කම් ස.තො.ස. විසින්ම ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව

(ඈ) දැනට භාණ්ඩාගාර ප්‍රතිපාදන නොමැතිව දෛනික වියදම් කරගෙන යාමට සංස්ථාවට ඇති හැකියාව

(ඉ) දැනට ලංකා ස.තො.ස. සමාගම ඇතුළු පිටස්තර ආයතනවලට සපයන ප්‍රවාහන සේවය වෙනුවට ස.තො.ස. ප්‍රධාන වෙළඳ කටයුත්ත වෙත ඉලක්ක වූ ප්‍රවාහන සේවාවක් ප්‍රවර්ධනය මගින් මෙහෙයුම් ප්‍රතිඵලය වර්ධනය කර ගැනීමේ හැකියාව.

(ඊ) අයවිය යුතු රු.861,725,558 ක් වූ ආදායමක් සංස්ථාව සතුව පැවතීම.

(උ) ගොඩනැගිලි, වාහන, යන්ත්‍රාගාර විශාල ප්‍රමාණයක් ප්‍රයෝජනයට ගැනීමට ඇති හැකියාව හෝ උපලබ්ධි කර ආදායම් ඉපයීමට ඇති හැකියාව

ඒ අනුව, ක්‍රියාකාර සැලැස්මේ ඉලක්කයන් සපුරා ගැනීමට සංස්ථාවට නොහැකි වී ඇත්තේ මූල්‍ය දුෂ්කරතා පවතින බැවින්ය යන කළමනාකරණයේ නියෝජනයන් පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි අතරම, සංස්ථාව ජාතික ආර්ථිකයේ යහපත උදෙසා ක්‍රියාත්මක කිරීමට කළමනාකාරිත්වය ප්‍රමාණවත් දායකත්වයක් ලබා දී නොමැති බැව්ද විගණනයේදී බැහැර කළ නොහැක.

3.2.17 අසම්භාව්‍ය වගකීම් හා නිසි අධිකාර් බලයෙන් තොර ගනුදෙනු

වත්කම් අත්පත් කර ගැනීම

ස.තො.ස. විසින් අවිධිමත් ගිවිසුමකට එළඹෙමින් 1992 වර්ෂයේදී රු.11,000 ක මාසික කුලියක් යටතේ හිගුරක්ගොඩ පිහිටි ගබඩා 02 ක් ලබා ගෙන තිබුණු අතර, එම ගිවිසුම අළුත්කර නොතිබුණද, 1998 වර්ෂයේ සිට එම කුලිය රු.50,000 කට එකහවී අදාල ගබඩා එපරිදිම පවත්වාගෙන ගියද කිසිදු කුලී ගෙවීමක් 2011 වර්ෂය දක්වාම කර නොතිබුණි. ඒ අනුව රු.9,192,000 ක්වූ අසම්භාව්‍ය කුලී වියදමක් (වගකීමක්) නිරීක්ෂණය වූ අතරම නිසි අධිකාර් බලයකින් තොරව රු.78,978,504 ක්වූ වියදමක් දරා වී මෝල් පරිශ්‍රයද ඉදිකර තිබුණි. මෙම අසම්භාව්‍ය කුලී වියදම මුළුමනින්ම මූල්‍ය ප්‍රකාශනවලින් බැහැරවී තිබුණි.

### 3.2.18 පත් කිරීම් හා උසස් කිරීම්

අනුමත කාර්ය මණ්ඩලයක් හා තනතුරුවල පුරප්පාඩු නොතිබියදී, නියි අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත පමණක්, මුදල් කළමනාකරු, ජ්‍යෙෂ්ඨ කළමනාකරු (පරිපාලන), අතිරේක සාමාන්‍යාධිකාරී ලෙස උසස් කිරීම් 03 ක්ද හා නීති නිලධාරී ලෙස පත් කිරීමක්ද සිදු කර තිබුණි.

### 4. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර සංස්ථාවේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. ඒ අනුව, පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) සැලසුම් කිරීම
(ආ) සංවිධාන ව්‍යුහය
(ඇ) භෞතික පාලනය
(ඈ) කාර්ය සාධනය
(ඉ) ණයගැතියන්
(ඊ) ණයහිමියන්
(උ) ස්ථාවර වත්කම්
(ඌ) අභ්‍යන්තර විගණනය
(එ) සේවක මණ්ඩල
(ඒ) බැංකු සැසදුම්
(ඔ) තොග පාලනය
(ඕ) කුලී ආදායම
(ක) වාහන පාලනය
(ග) ලිපි ලේඛන නඩත්තු කිරීම
(ජ) ගිණුම්කරණය
(ට) විගණන විමසුම්වලට ප්‍රතිචාර
(ඩ) සුළු මුදල් පාලනය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.

## 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (ඇ) වගන්තිය ප්‍රකාර 2010.12.31 දිනට අවසන් වසර සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ ගිනුම් සම්බන්ධයෙන් විගණකාධිපතිතුමාගේ වාර්තාව.

2012 ජුලි මස 20 දිනැති අංක SC/E/CWE/FA/AMEND/A/2010 දරන ලිපිය සම්බන්ධයෙනි. ඉහත වාර්තාව සම්බන්ධයෙන් පහතින් සඳහන් කර ඇති අපගේ නිරීක්ෂණයන් මේ සමඟ එවමි:

**සභාපතිගේ අදහස් දැක්වීම**

2.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අදහස් දැක්වීම**

2.2.1. **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම:**

අ) 2011 නොවැම්බර් 01 දින ඉදිරිපත් කරන ලදී.
(යොමු අංක CWE/GA/2011/R-AR-14 දරන ලිපිය)

ආ) විකුණුම් පිරිවැයෙහි සංයුතිය 1998.12.31 දිනට පෙර මූල්‍ය ප්‍රකාශන මගින් පෙන්වා දී ඇත. මෙසේ පෙන්වාදීම මගින් අපගේ තරඟකාරී ආයතන වෙත අපගේ රහස්‍ය තොරතුරු අනාවරණය වන බැවින් කලින් සිදු කළ පරිදි මූල්‍ය ප්‍රකාශන වල විකුණුම් පිරිවැයෙහි සංයුතිය අප විසින් පෙන්වා දී නොමැත. මේ සම්බන්ධයෙන් මීට පෙර විගණකාධිපතිවරයා විසින් විමසීම සිදු කොට නොමැත. ඇමුණුම 1හි විකුණුම් පරිවැයෙහි සංයුතිය දක්වා ඇත.

2.2.2 **ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත:**

අ) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 03 :-

පොදු ගණකාධිකරණ ප්‍රතිපත්ති, වත්කම් සහ තක්සේරු කිරීමේ පදනම, වගකීම් සහ ප්‍රතිපාදන, ලාභ සහ අලාභ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිත අංක 3 ට අනුකූලව කටයුතු කර ඇත. (යොමුව : පිටු අංක 5- 6 සහ 18-19)

ආ) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 05:-

පූර්ව වර්ෂයන්හිදී සිදුකළ පරිදි සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාව මත ගත් මිලට හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන් දෙකෙන් අඩු අගය මත තොග අගය කොට ඇත.

ඇ) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 09 සහ 18:-

i. ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය රු. 30, 709, 278/= (යොමුව: පිටු අංක 10) වන අතර එම වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පිටු අංක 3 හි දක්වා ඇත.

ii. 2009.12.31 දිනට සහ 2010.12.31 දිනට ස්වාධීන තක්සේරුකරුවන් විසින් මෝටර් වාහන, වෙළඳපොළ අගය මත ප්‍රත්‍යාගණනය කොට ඇත. ඊට අදාල ලියකියවිලි විගණනය සඳහා ඉදිරිපත් කොට ඇත. (කරුණාකර 2011.12.09 දිනැති අංක CWE/GA/(F.A.10)/2011 දරන ලිපිය බලන්න)

ඈ) ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 36

i. රු. 1, 393, 797/= ක් වූ නෛතික වියදම් පරිපාලන වියදම් වශයෙන් දක්වා ඇත. (යොමුව : පිටු අංක 08) මෙම ගෙවීම සම්බන්ධයෙන් අදාළ වන වව්චර් අප සතුව ඇත. 2011.11.21 දින අදාළ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.

## 2.2.3 අගය වැඩියෙන් දැක්වීම සහ අඩුවෙන් දැක්වීම.

2011 වර්ෂයේදී, මේ සම්බන්ධයෙන් අදාළ වන සුදුසු ගැලපීම් සිදුකිරීම සඳහා සැලකිලිමත් වී ඇත.

## 2.2.4 නොසැසඳූ පාලන ගිනුම

අ) ලීබඩු සහ උපකරණ : 2009.12.31 දිනට උපලේඛන ගත ශේෂය ලෙජර් ගිනුමේ ශේෂය සමඟ නොසැසඳේ.
2010.12.31 දිනට උපලේඛනගත ශේෂය සමඟ ලෙජර් ගිනුමේ ශේෂය ගැලපීම සඳහා 2010 වර්ෂයේදී අප විසින් සුදුසු ගැලපීම් සිදුකොට ඇත. වර්තමාන තත්ත්වය පහතින් දක්වා ඇත.

| | උපලේඛනය පරිදි ශේෂය 2010.01.01 රු. | ලේජර් ගිණුම පරිදි ශේෂය 201.01.01 රු. |
|---|---|---|
| ලී බඩු සහ උපකරණ | 51,744,688/= | 51,744,688/= |
| සමුච්චිත ක්ෂය | 50,194,287/= | 50,194,287/= |

මෙලෙස ලෙජර ගිනුමේ ශේෂයන් සමඟ උපලේඛනගත ශේෂය සසඳා ඇත.

ආ) කරුණාකර 2011.11.01 දින එවන ලද පිළිතුර බලන්න.
යොමු අංකය : CWE/GA/2011/R-AR-14

ඇ) 2011 ඔක්තෝබර් 31 දින එවන ලද පිළිතුර බලන්න.
යොමු අංකය : CWE/GA/2011/R-AR-17

ඇ) මාස 12ක කාලය සඳහා ලෙජරය මුද්‍රණය කිරීම ඉතා වියදම් අධික කාර්යක් මෙන්ම අධික කාලයක් සහ වෙහෙසක් වැය කළයුතු කාර්යයකි. කෙසේ වුවද 2010 වර්ෂයේ පොදු ලෙජරය මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

**සංශෝධිත මූල්‍ය ප්‍රකාශන - 2010**

ඉ) ආදායම් ප්‍රකාශය - නැවත ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව මුළු වියදම - 165,319,509

- 2011 .02.25 දින ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන පරිදි එකතුව - 165,172,151

වෙනස - 147,358

2011 පෙබරවාරි 25 දින ඉදිරිපත් කළ ගිනුම් අවසන් වශයෙන් සකස් කිරීමට පෙර අංක 466508 සහ 466510 (ප්‍රධාන කාර්යාලය) වෙතින් සුළු මුදල් අග්‍රිමය වශයෙන් දරන ලද පහත සඳහන් වියදම් ඇතුලත් වී නොමැති බව නිරීක්ෂණය වේ.

| | ගිණුම් අංකය | මුදල |
|---|---|---|
| ගමන් වියදම් | 6171 | 6, 200.00 |
| අනියම් වැටුප් | 6109 | 64, 283.00 |
| පාරිභෝගික ද්‍රව්‍ය ගබඩා | 6272 | 14, 600.00 |
| දුරකථන | 6241 | 8, 440.00 |
| පුවත්පත් | 6245 | 2, 690.00 |
| විදුලිය | 6235 | 2, 845.00 |
| තැපැල් ගාස්තු | 6233 | 994. 50 |
| වෙනත් | 6274 | 47, 306 .98 |
| | | 147,359.48 |

ඊ) අදාල නොවේ, නිවැරදි තත්ත්වය පිළිබඳව විගණනය වෙත පැහැදිලි කොට ඇත. යොමුව: 2011 ඔක්තොබර් 31 දින සහ නොවැම්බර් 01 දින යවන ලද ලිපි.

## 2.2.5 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිනුම්

අ) දිගුකාලයක් තිස්සේ පැවති ගෙවිය යුතු බදු කුලී කපා හැරීමට සුදුසු පියවර ගෙන ඇත.

ආ) 2010 වර්ෂයේ මාස 12 සඳහා අයවිය යුතු බදු කුලී අයකර ගෙන ඇත. 2008 වර්ෂයට පෙර කාල පරිච්ඡේදය සම්බන්ධයෙන් 2010.12.31 දිනට ගෙවිය යුතු ශේෂය රු. මිලියන 1.7කි.

ඇ) 2011.11.08 දින අදාල පිළිතුරු යවා ඇත.

## 2.2.6. මුදල් සහ බැංකු ශේෂය

ශේෂ පිරික්සුම සහ ශේෂ පත්‍රය අනුව කොමර්ෂල් බැංකු ගිනුමේ සහ ඉතිරිකිරීමේ ගිනුමේ ශේෂය පහත සඳහන් පරිදි වන බව නිරීක්ෂණය වේ.

| | |
|---|---|
| ඉතිරිකිරීමේ ගිනුම (1545410) | 38,341,308.18 |
| ජංගම ගිනුම (1545428) | 16,298,762.49 |
| ශේෂ පත්‍රය අනුව (පිටු අංක 15) | 54,640,070.67 |

මුදල් පොත අනුව ශේෂය පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| ඉතිරිකිරීමේ ගිනුම | 38,341,308.18 |
| ජංගම ගිනුම | 12,573,250.73 |
| | 50,914,558.91 |

රු. 3,725,511.76 ක වෙනස අත් වැරදීමකින් සිදුවූවක් වන අතර, ශේෂ පිරික්සුමේ අගයන් නිවැරදිව දක්වා ඇත. කෙසේ වුවද, මෙම වෙනස ඇති වීමට හේතුව සොයා බලා හැකි ඉක්මනින් විගණනය වෙත වාර්තා කිරීමට අවශ්‍ය පියවර ගනු ඇත.

## 2.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

| | | |
|---|---|---|
| අ) | 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(5)(ආ) පරිච්ඡේදය | 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (5)(ආ) පරිච්ඡේදය හා අනුකූලව ගිනුම් කටයුතු සිදු කර ඇති අතර එය සනාථ කෙරෙන සියලුමඋපලේඛන හා ලියකියවිලි විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර ඇත. |
| ආ) | 1949 අංක 47 දරන සමූපකාර තොග වෙළඳ සංස්ථා (සංශෝධිත) පනතේ 4 වන පරිච්ඡේදය (1966 අංක 38 දරණ පැරණි පනතේ 3 වන පරිච්ඡේදය) | සතොස සභාපතිවරයා ලක් සතොස ආයතනයේද සභාපති වරයා විය. මේ නිසා අදාළ ගිවිසුම් සඳහා සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ අධ්‍යක්ෂකවරුන් විසින් අත්සන් තබා ඇති අතර සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදාල ගනුදෙනු අනුමත කොට ඇත. |
| යොමුව - | ලක් සතොස ආයතනය සමඟ එළැඹි බඳු ගිවිසුම සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ සභාපතිවරයා විසින් අත්සන් තබා නොමැති බව | එකී කාල පරිච්ඡේදය තුළදී සතොස සභාපතිවරයා ලංකා සතොස ආයතනයේද සභාපතිවරයා වූ අතර එම නිසා ලංකා සතොස ආයතනයේ සභාපතිවරයා වශයෙන් ඔහු විසින් එම ගිවිසුමට අත්සන් තබා ඇත.මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා පියවර ගනු ඇත. |

| | |
|---|---|
| ඇ) 2003 ජුනි 02 දිනැති අංක PED 12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | |
| I. 5.1.2 වගන්තිය | ඒකාබද්ධ සැලැස්ම යාවත්කාලීන කොට ඇත. |
| II. 5.1.3 වගන්තිය | 2011 සැප්තැම්බර් මස 23 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. 2011.12.28 දින එය නැවතත් ඉදිරිපත් කර ඇත. |
| III. 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 5.2.2 සහ 8.3.2 පරිච්ඡේද සහ (1.1.6 ) සහ මුදල් රෙගුලාසි අංක 1646 සහ 1.3 පරිච්ඡේදය | i. පූර්ව වර්ෂවල සතොස විසින් විධායක නිලධාරීන් කිහිප දෙනෙකු සඳහා ඉන්ධන දීමනාවක් සපයා ඇති අතර එපරිදි එම පහසුකම අඛණ්ඩව පවත්වාගෙන ගොස් ඇත.<br>ii. මෝටර් රථ ධාවන සටහන ප්‍රවාහන අංශය සතුව පවතී. |
| ඈ) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3 වගන්තිය | |
| යොමුව : අදාළ රීතීන්ට අනුකූලව ආකෘති අංක 1 ඉදිරිපත් කොට නොමැත. | |
| ඉ) 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන වගන්තිය සහ ආයතන සංග්‍රහයේ Vii පරිච්ඡේදය | |
| යොමුව : විධායක නිලධාරීන් වෙත ගෙවූ වැඩ බැලීමේ දීමනා (රු. 213, 832.00) | ආයතන සංග්‍රහයේ සඳහන් කර ඇති පරිදි සහ සභාපතිවරයා විසින් අනුමත කරඇති පරිදි වැඩ බැලීමේ දීමනා ගෙවන ලදී. |
| ඊ) ප්‍රසම්පාදන අත්පොතේ 3.5 පරිච්ඡේදය සහ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14 පරිච්ඡේදය | 2011.11.08 දිනැති අංක CWE/GA/2011-R – 10 දරන ලිපිය බලන්න. |
| යොමුව : වායු සමීකරණ යන්ත්‍ර සඳහා විදුලිය | |

උ) 2007 නොවැම්බර් 01 දිනැති අංක 8-1/1/73 දරන අමාත්‍යාංශ චක්‍රලේඛය

| | |
|---|---|
| වාහන ධාවන වාර්තා වශයෙන් ආකෘති අංක පොදු 268 භාවිතා කොට නොතිබුනි. | පූර්ව වර්ෂයන්හිදී සතොස විසින් වාහන භාවිතය සම්බන්ධයෙන් විශේෂිත ක්‍රියාපටිපාටියක් සම්මත කර ඇති අතර එකී ක්‍රියාපටිපාටිය අනුගමනය කොට ඇත. |

ඌ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

| | | |
|---|---|---|
| (i.) | මුදල් රෙගුලාසි 103 | 2011 මාර්තු මස 25 වන දින එවා ඇති අංක CWE/GA/2011/R-AR-2 දරන ලිපිය බලන්න. |
| (ii.) | මුදල් රෙගුලාසි 103 (1) | අස්ථානගතවී ඇති උපකරණ සම්බන්ධයෙන් විමර්ශනයක් පැවැත්වුවද එකී උපකරණ සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයන් ස්වයං විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය මත විශ්‍රාම ගොස් ඇති බැවින් එම අස්ථානගත වීම සම්බන්ධයෙන් එකී පුද්ගලයන් වගකිව යුතු බවට නිශ්චය කිරීම ප්‍රායෝගික නොවේ. |
| (iii.) | මුදල් රෙගුලාසි 133 | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර විගණන කටයුතු සිදු කිරීම සඳහා දැනට නිලධාරියකු පත්කොට ඇත. |
| (iv.) | මුදල් රෙගුලාසි 137 138, 228, 245 (1) | (i) 2011 ජුලි 04 දින එවා ඇති අංක CWE/GA/2011/R-AR-16 දරන ලිපිය බලන්න.<br>(ii) අනුකූලතාව දැක්වීම සම්බන්ධයෙන් සැලකිලිමත් වී ඇත. |
| (v.) | මුදල් රෙගුලාසි 225 (4) | වව්චර් සකස්කිරීම සහ පරීක්ෂා කළ බවට සාක්ෂියක් වශයෙන් වව්චර වල කෙටි අත්සන් යොදන ලෙස කාර්ය මණ්ඩලය සඳහා දැනටමත් උපදෙස් ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| (vi.) | මුදල් රෙගුලාසි 245(1) සහ 257 | අනුකූලතාව දැක්වීම සම්බන්ධයෙන් සැලකිලිමත් වී ඇත. |
| (vii.) | මුදල් රෙගුලාසි 261(3) | අදාල වියදම් සම්බන්ධයෙන් අරමුදල් වල ප්‍රමාණවත්භාවය පිළිබඳව නිශ්චය කර ගැනීම සඳහා චෙක්පත් නිකුත් කිරීමට පෙර බැංකු ප්‍රකාශයේ ශේෂය පරික්ෂා කරනු ලැබේ. අදාල වාර්තා 2012 ජනවාරි 01 දින සිට පවත්වාගෙන එනු ලැබේ. |
| (viii.) | මුදල් රෙගුලාසි 264 (1) | (i) රිසිට්පතක් ලබාගැනීම සම්බන්ධයෙන් සැලකිලිමත් වී ඇත.<br>(ii) 2011.11.08 දින එවන ලද අංක CWE/GA/2011/R-AR-10 ලිපිය බලන්න. |
| (ix.) | මුදල් රෙගුලාසි 272 (1) | සියලුම වව්චර් වැදගත්කමේ අනුපළිවෙළට අංකනය කර විගණනය වෙත ඉදිරිපත් කොට ඇත. |
| (x.) | මුදල් රෙගුලාසි 272(3) | අනුකූලතාව දැක්වීම සම්බන්ධයෙන් සැලකිලිමත් වී ඇත. |
| (xi.) | මුදල් රෙගුලාසි 454 | මූල්‍ය අංශය මගින් ස්ථාවර වත්කම් ලැයිස්තු පවත්වාගෙන යන අතර එම ලැයිස්තු යාවත්කාලීන කිරීම සඳහා පියවර ගනු ඇත. |
| (xii.) | මුදල් රෙගුලාසි 754 සහ 757 (1) (අ) | පන්නෙගමුව සහල් මෝලේ ඉන්වෙන්ට්‍රි වාර්තා සැසඳීම සඳහා අවශ්‍ය පියවර ගනු ඇත. |
| (xiii.) | මුදල් රෙගුලාසි 756 | අනුකූලතාව දැක්වීම සම්බන්ධයෙන් සැලකිලිමත් වී ඇත. |
| (xiv.) | මුදල් රෙගුලාසි 757 (2) (අ) | අනුකූලතාව දැක්වීම සම්බන්ධයෙන් සැලකිලිමත් වී ඇත. |
| (xv.) | මුදල් රෙගුලාසි 785(4) | අනුකූලතාව දැක්වීම සම්බන්ධයෙන් සැලකිලිමත් වී ඇත. |

**2.2.9 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම.**

(අ) සහ (ආ)

2011 ඔක්තොබර් 31 දිනැති ලිපිය සහ 2011 නොවැම්බර් 01 දිනැති අංක CWE/GA/2011/R-AR-17 සහ CWE/GA/2011/R-AR-14 ලිපි බලන්න.

**3.2 මෙහෙයුම් සමාලෝචනය**

**3.2.1 ඒකාබද්ධ සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම**

අ) අදාල PED 12 චක්‍රලේඛය හා අනුකූල වීමට සැලකිලිමත් වී ඇත.

ආ) පන්නෙගමුව ගබඩාව වී අලෙවි මණ්ඩලයට අයත් බැවින් මෙය කළමනාකරණ තීරණයකි.

ඇ) මූලාමය බාධා හේතුවෙන් සහල් මෝල ක්‍රියාත්මක කරවීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමට සැලසුම් සකස් කිරීමට නොහැකි විය. නමුත් සහල් මෝල අක්‍රියව පවත්වාගෙන යා නොහැකි නිසා වී අලෙවි මණ්ඩලයෙන් වී මිලදී ගෙන කොටන ලද සහල් සඳහා කිලෝවකට රු. 3.50/= බැගින් අයකර නිෂ්පාදිත සහල් ප්‍රමාණය ලංකා සතොස වෙත අලෙවි කරන ලදී.

ඇ) -එම-

ඉ) මූල්‍යමය බාධා හේතුවෙන් ප්‍රසම්පාදනයන් සඳහා විශේෂිත සැලසුමක් සකස් කළ නොහැකි වූ අතර එම හේතුවම නිසා අනෙකුත් ආශ්‍රිත මෙහෙයුම් කටයුතු ද සැලසුම් කිරීමට නොහැකි විය.

ඊ) සහ උ) මූල්‍යමය බාධක හේතුවෙන් බැංකු පහසුකම් ලබා ගැනීමට නොහැකි විය.

ඌ) විශේෂිත අත්‍යවශ්‍ය භාණ්ඩවල හිඟකම සහ වෙළඳපොළ මිල ගණන් වල ඉහලයාමේ ප්‍රවනතාව හේතුවෙන් එකී භාණ්ඩ දේශීය වොළදපොළ තුලින් හා සී/ස ස්ටේට් ට්‍රේඩිං (කෝපරේටිව් හෝල්සේල්) සමාගම වෙතින් මිලදී ගැනීමට අමාත්‍යාංශය විසින් උපදෙස් දී ඇත.

**3.2.2 මහජන බැංකුව වෙත ගෙවිය යුතු ලංසු සුරැකුම් ණය රු. 207,050,943/=**

මහභාණ්ඩාගාරය විසින් වගකීමේ කාලය 2012 ජූනි මස දක්වා දීර්ඝ කර ඇත.

### 3.2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතාව

අ) අප දැනටමත් තොග සහ ඉන්වෙන්ට්‍රි අයිතම ඇණවුම් තොට ඇති අතර ගෙවිය යුතු කුලී සඳහා හර පත් මගින් මුදල් ලබාගෙන ඇත.

ආ) ටෙන්ඩර් ක්‍රියාපටිපාටියට යටත්ව ඉතිරිව ඇති සියලුම අයිතමයන් දැනටමත් ඉවත් කොට ඇත.

ඇ) මෙය කළමනාකරණ තීරණයකි.

ඈ) අදාල සියලුම ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 2004 වර්ෂයේදී ඉවත්ව ගොස් ඇති බැවින් මෙම කාරණය සම්බන්ධයෙන් අදහස් දැක්වීමට වර්තමාන කළමනාකරණයට නොහැකි වී ඇත. කෙසේවුවද ආපදා ණය, ණයට ගැනුම්, සහ අධිභාර සම්බන්ධයෙන් සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයවිය යුතු මුදල් ආදිය වන්දි අවසන් ගෙවීම් මගින් විධිමත් පරිදි අයකරගෙන ඇති බව දැනට පවත්නා වාර්තා වලින් නිරීක්ෂණය වේ.

ඉ) 2011.12.08 දිනැති අංක CWE/GA/(F.A.10)/2011 ලිපිය බලන්න.

නොවිසඳා ඇති නඩු වල අසම්භාව්‍ය වගකීම් වටිනාකම රු. මිලියන 3.8 ක් බව ගිනුම් වල 18 පිටුවේ අංක 18 යටතේ දක්වා ඇත.

ඊ) 2011.12.08 දින අදාළ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කරන ලදී.

උ) අධිකරණය මගින් රු. මිලියන 15 ක මුදලක් ගෙවන මෙන් නියෝගයක් නිකුත් කර ඇති අතර අප විසින් රු. මිලියන 9ක මුදලකට එය තිරවුල් කර ගැනීමට එකඟ විය.

ඌ) අමාත්‍යාංශයේ නියෝග මත සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අයත් පරිශ්‍රයන් බජට් ෂොප් සඳහා කුලියට ලබා දී ඇති අතර එය ඉතාමත් ඉක්මනින් සිදු කිරීමට අවශ්‍යව තිබු නිසා ඒ සඳහා ගිවිසුම් සකස් කිරීමට කාලයක් නොතිබුනි. මෙලෙස සාමාන්‍ය ක්‍රියාපටිපාටි වලින් පරිබාහිරව අමාත්‍යාංශයේ නියෝගයන්ට අනුකූල වීමට අපට සිදු විය. වෙළඳපොළ අගයන් මත කුලී මුදල් අයකර ගෙන ඇත.

එ) පූර්ව වර්ෂයන්හිදී මෙම අක්‍රීය යන්ත්‍ර ඉවත් කිරීමට අප විසින් කිහිප වරක්ම ප්‍රයන්ත දරන ලදී. කෙසේ වුවද මෙම යන්ත්‍ර ඉවත් කිරීමේ හැකියාව සොයා බැලීම සම්බන්ධයෙන් අප ආයතන ගණනාවක් සමඟ සමීපව කටයුතු කරන්නෙමු.

### 3.2.4 <u>මෙහෙයුම් ආකාර්යක්ෂමතාවන්</u>

නිරීක්ෂණ:

අ) අනුකූලතාව දැක්වීම සඳහා සම්බන්ධයෙන් සැලකිලිමත් වී ඇත.

ආ) ලක් සතොස ආයතනයට යටිතල පහසුකම් සැපයීමට සතොස ආයතනයට අවශ්‍යාව තිබූ බැවින් ලක් සතොස ආයතනයට සතොස පරිශ්‍රයන් කුලියට ලබා දිම කළමණාකරන තීරණයකි. 2011 අප්‍රේල් මස සිට මාසිකව රු මිලියන 1.7 ක කුලී මුදලක් අයකර ගැනීමට පියවර ගෙන ඇත.

ඇ) ඉතිරි බිම් ප්‍රදේශය සඳහා කුලිය ගණනය කිරීමට පියවර ගෙන ඇත. (2011.12.08 දිනැති අංක CWE/GA/(F.A.10)/2011 දරන ලිපිය බලන්න.)

### 3.2.5 <u>ඌණ උපයෝජිත වත්කම්</u>

අ) මෙම මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය කෙරෙන අරමුදල් ආයතනය සතුව තිබේද යන්න මත යථා කාලයේදී සුදුසු පියවර ගනු ඇත.

ආ) අප විසින් දැනටමත් නිෂ්කාර්ය පරිශ්‍රයන් ලක් සතොස ආයතනයට කුලියට ලබා දී ඇති අතර පැරණි ලොරි වෑන් සහ කාර් කිහිපයක් ඉවත් කොට ඇත.

ඇ) 2003 දෙසැම්බර් 01 දිනැති මිලදී ගැනුම් ගිවිසුමේ 6.2. (ඇ) පරිච්ඡේදය ප්‍රකාර සී/ස සතොස රිටේල් සමාගම සමඟ පැවති ජංගම ගිනුමේ ශේෂයෙන් රු. 381, 412, 519 /= ක මුදලක් කපා හරින ලදී. 2004.03.31 දිනට මීට අදාල සටහන් සී/ස සතොස රිටේල් ආයතනය විසින් ගිනුම් ගතකොට ඇත. 2011 සැප්තැම්බර් මස 12 දිනැති අංක SC/E/CWE/FA/AQ/10/D/08 දරන විගණන විමසුමට පිළිතුරු වශයෙන් මීට අදාල තොරතුරු විගණනය වෙත ලබා දී ඇත.

ඈ) වාහන 58 න් වාහන 35 ක්ම අධිකරණ නියෝගයක් මත අත් අඩංගුවට ගෙන ඇත. 2011 දෙසැම්බර් මස වාහන පිළිබඳ භෞතික සත්‍යාපනයකින් අනතුරුව අස්ථාන ගතව ඇති වාහන සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට සැලකිලිමත් වී ඇත.

ඉ) ලංකා සතොස ආයතනය සමඟ මෙම කාරණය සම්බන්ධයෙන් සාකච්ඡා කෙරෙනු ඇති අතර සුදුසු ක්‍රියාමාර්ග යථාකාලයේදී ගනු ඇත. ලංකා සතොස ආයතනය වෙත සවරන ලද වත්කම්වල සවිස්තරාත්මක උපලේඛන විගණනය වෙත භාර දෙන ලදී.

ඊ) මූල්‍යමය බාධා හේතුවෙන්, ණය පදනම මත වී අලෙවි මණ්ඩලය වෙතින් වී ලබාගෙන ඇත. එම නිසා වී අලෙවි මණ්ඩලය විසින් සපයනු ලබන වී සැපයුම මත සහල් මෝලේ ක්‍රියාකාරිත්වය රඳා පවතිනු ඇත.

**3.2.6 ගනුදෙනු ප්‍රතිව්‍යුහගත කිරීම.**

අනාගත වගකීම් සම්බන්ධයෙන් උපදෙස් අපේක්ෂා කරමින් ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් වූ සවිස්තරාත්මක වාර්තාවක් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇත.
(2011 නොවැම්බර් 15 දිනැති අංක CEW/FM/Tre/2011 දරන ලිපියේ පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කරන ලදී.)

**3.2.7 ආයෝජන**

2011 වර්ෂයේදී කපා හැරීමට සැලකිලිමත් වී ඇත.

**3.2.8. වාහන උපයෝගීකර ගැනීම**

අ) අධිකරණ නියෝගය මත අත් අඩංගුවට ගත් වාහන 35 අතරට මෙයද ඇතුලත් වේ. 2012 ජනවාරි මස මෙම නඩුව අවසන් වූ පසුව මෙම සියලුම වාහන ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ඇත.

ආ) -එම-

ඇ) ප්‍රවාහන අංශයේ ක්‍රියාකාරිත්වය සමාලෝචනයට ලක් කෙරෙනු ඇත. මේ සම්බන්ධයෙන් ප්‍රවාහන කළමනාකරු වෙත සුදුසු උපදෙස් ලබා දීමට පියවර ගනු ඇත.

**3.2.9. පාරිතෝෂික අරමුදලක අවශ්‍යතාවය**

2012 වර්ෂයේදී මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනු ඇත.

**3.2.10 ඵලදායී නොවන ගනුදෙනු**

සහල් මෝලේ ක්‍රියාකාරිත්වය වී අලෙවි මණ්ඩලය විසින් සපයනු ලබන වී මත රඳා පවතී.

**3.2.11 අක්‍රමවත් ගනුදෙනු**

හිඟ මුදල් සම්බන්ධයෙන් 2010.12.13 දිනැති අංක SC/E/CWE/10/C/05 දරන විගණන විමසුම සඳහා අප විසින් දැනටමත් පිළිතුරු යවා ඇත. නමුත් අපගේ වාර්තා අනුව හිඟ මුදල රු.496, 706/= ක් පමණි.

2011.04.04 දිනැති අංක CWE/GA/10/R-17 දරන පිළිතුර)
මේ සම්බන්ධයෙන් සුදුසු පියවර ගනු ඇත.

**3.2.12 2010 වර්ෂය සඳහා සහල් අලෙවි ඉලක්ක ප්‍රක්ෂේපණය කොට නොමැති වීම.**

ලක් සතොස වෙත අලෙවි කළ සහල් සඳහා වාරික පදනමින් අයකර ගෙන ඇත.

### 3.2.13 හඳුනාගත් අලාභ

අ) භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයට අනුව ලක් සතොස වෙතින් අයකර ගත් අලෙවි ආදායම්

ආ) පන්නෙගමුව සහල් මෝලේ ගබඩා පහසුකම් නොමැති වීම හේතුවෙන් එම තොග නැවතත් කොළඹට රැගෙන විත් පුද්ගලික අංශයේ ගැනුම්කරුවන් වෙත අලෙවි කරන ලදී.

ඇ) ඉදිරිපත් වූ ඉහළම මිල ගණන් සඳහා එම තොග ලබා දී ඇත.

ඈ) බේකරි හිමියන් වෙතින් අයවිය යුතු මුදල් වලින් ප්ලාස්ටික් භාජන වල වටිනාකම අඩුකරගෙන ඇත.

### 3.2.14 සැපයුම් සහ සේවා

2011.11.08 දින පිළිතුර යවන ලදී
( යොමු අංකය CWE/GA/2011-R-10)

### 3.2.15 අනුබද්ධ පාර්ශ්වයේ සමාගම් සමඟ ගනුදෙනු

සී/ස ස්ටේට් ට්‍රේඩිං ( කෝපරේටිව් හෝල්සේල්) සමාගම විසින් ආනයනය කරන ලද භාණ්ඩ ඉවත් කොට ඇති අතර අප විසින් දරන ලද වියදම අයකර ගෙන ඇත.

### 3.2.17 අසාමාන්‍යභාවයන් සහ නීති පරිදි සිදු කළ ගනුදෙනු

අතිගරු ජනාධිපතිතුමියගේ මහ පෙන්වීම යටතේ 1997/1998 වර්ෂයන්හිදී රජයට අයත් පරිශ්‍රයක මෙම සහල් මෝල ඉදිකරන ලද අතර කුලී ගෙවීම සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹී නොමැත.

### 3.2.18 පත්කිරීම් සහ උසස් කිරීම්

2011.11.03 දින එවන ලද පිළිතුර බලන්න.
(අංක CWE/GA/2011-R-4 දරන ලිපිය)

ඔබේ විශ්වාසී,

එරාජ් ටී ප්‍රනාන්දු
සභාපති
සතොස

12

ඇමුණුම 1

## 201.12.31 දින විකුණුම් පිරිවැය

| | |
|---|---|
| 2010.01.01 දිනට ආරම්භක තොගය | 22, 984, 347 . 00 |
| මිලදී ගැනුම් | 261, 431, 495 . 00 |
| අඩු කලා | 284, 415, 842 . 00 |
| 2010.12.31 දිනට අවසන් තොගය | 103, 588, 084 . 00 |
| | 180, 827, 758 . 00 |